## මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

# 01-සිංහල

# 2019

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂය මාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක හෝ අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පළමු වරට මූලික පිරිවෙන් අවසාන විභාගය 2019 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තා ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගයට අදාළ සිංහල විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පිරිවෙන් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති අකාරය, විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද I හා II පත්‍රවල ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවල හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. මූලික පිරිවෙන් අවසාන විභාගයේ සිංහල විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබා ගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟා වීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

2022.11.18

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එල්. එම්. ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්

## පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක වන මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොට ගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ජාතික අධ්‍යාපනයේ කේන්ද්‍රය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වා ගෙන යාම, එය පෝෂණය කිරීම ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම සහ බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොට ගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කෑරගල පද්මාවතී, වීදාගම සිරි ඝනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සාම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට 1981 පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 135ක් විභාගය අසමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂකයකු අනිවාර්ය විෂයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයන් 02ක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන් ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌණ සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌණ සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළමුවරට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරින්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එල්.එම්.ඩී. ධර්මසේන<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඩී.ඩී.වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග |
| විෂය සම්බන්ධීකරණය | : | නිමාලි නදීකා සූරිය ආරච්චි<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන ශාඛාව |
| සංස්කරණය | : | ශ්‍රියානි අබේවික්‍රම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I (විශ්‍රාමික)<br>නො.360/6, මායා මාවත,<br>මාකුඹුර, පන්නිපිටිය |
| ලේඛක මණ්ඩලය | : | ශ්‍රියානි අබේවික්‍රම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I (විශ්‍රාමික)<br>නො.360/6, මායා මාවත,<br>මාකුඹුර, පන්නිපිටිය<br><br>ඩබ්.ඒ.ඩබ්. වනසුන්දර<br>ගුරු උපදේශක (විශ්‍රාමික)<br>අක්කර දහය පාර, පොල්වත්ත,<br>අම්බුළුගල, මාවනැල්ල<br><br>එච්.එම්.ඩී. බණ්ඩා<br>පරිවේණාචාර්ය<br>නු/ශ්‍රී/ ධර්මෝදය මහා පිරිවෙන,<br>මාදන්වල, හඟුරන්කෙත<br><br>පූජ්‍ය ගලහිටියේ අමරවංස හිමි<br>පරිවේණාචාර්ය<br>ශ්‍රී සුමංගලාරාමය,<br>මාහගීල්ල, බෙලිඅත්ත |
| පරිගණක පිටපත සැකසුම | : | එම්.ඒ. චතුරි කා මධුමාලි<br>දත්ත සටහන්කරු |
| පිටකවරය නිර්මාණය | : | ආර්.එම්.එන්. ශෙහාන් යසරත්න<br>දත්ත සටහන්කරු |

## පටුන


පිටු අංකය

I කොටස

1 විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු 1

1.1 සිංහල විෂය අධ්‍යයනයේ අරමුණු

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5

1.3.2 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටසෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 6

1.3.3 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටසෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 6

1.3.4 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටස සඳහා සාධනය 7

1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 8

1.3.6 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 8

1.3.7 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 9

II කොටස

2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 10

2.1.2 I ප්‍රශ්න පත්‍රය - I කොටස 11

2.1.3 I ප්‍රශ්න පත්‍රයේ I කොටස සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 17

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - තේමා අනුව 18

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ I කොටසේ ප්‍රශ්නවල වරණ තෝරා ගෙන ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස 19

2.1.6 I ප්‍රශ්න පත්‍රයේ I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 20

2.2 I ප්‍රශ්න පත්‍රයේ II කොටසේ ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 I ප්‍රශ්න පත්‍රයේ II කොටසේ එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 23

2.3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 36

2.3.2 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 37

III කොටස

3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 56

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 57

# I කොටස

## 1 විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 සිංහල විෂය අධ්‍යයනයේ අරමුණු

1. ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කිරීම.
2. සිංහල භාෂාවේ ව්‍යාකරණය සහ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.
3. භාෂාවේ වාච්‍යාර්ථ හා ලක්ෂ්‍යාර්ථ, ව්‍යාංග්‍යාර්ථ වටහා ගැනීම.
4. ප්‍රකාශනය, ව්‍යවහාරය හා අර්ථග්‍රහණ ශක්තිය වර්ධනය කරලීම.
5. අවබෝධය, විශ්ලේෂණය, සංස්ලේෂණය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම.
6. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලිය හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීම හා වාංමාලාව පෝෂණය කර ගැනීම.
7. විවිධ යුගවලට අයත් සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.
8. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් රසඥතාව වර්ධනය කර ගැනීම මගින් ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම.
9. විශ්වවිශ්‍රැත සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරිම.
10. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයට හුරු කිරීම.
11. සිංහල භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව සහ තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.
12. සන්නිවේදන කාර්යය පහසුකරලීම සඳහා සාම්ප්‍රදායික භාෂා උපාංග නිවැරදි ව භාවිතයට හුරු කිරීම.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2242 | 28 | 2270 |
| ඉංග්‍රීසි | 12 | 0 | 12 |
| එකතුව | **2254** | **28** | **2282** |

**වගුව 1**

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 28 | 1.24 | - | - | 28 | 1.24 |
| B | 118 | 5.24 | 1 | 3.57 | 119 | 8.81 |
| C | 617 | 27.37 | 5 | 17.85 | 622 | 45.22 |
| S | 1047 | 46.45 | 11 | 39.29 | 1058 | 85.74 |
| W | 444 | 19.70 | 11 | 39.29 | 455 | 58.99 |
| එකතුව | **2254** | **100.00** | **28** | **100.00** | **2282** | **100.00** |

**වගුව 2**

## 1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 153 | 4 | 2.61 | 9 | 5.88 | 40 | 26.14 | 71 | 46.41 | 124 | 81.05 | 29 | 18.95 |
| ගම්පහ | 205 | 1 | 0.49 | 12 | 5.85 | 66 | 32.2 | 93 | 45.37 | 172 | 83.9 | 33 | 16.1 |
| කළුතර | 128 | 3 | 2.34 | 10 | 7.81 | 39 | 30.47 | 56 | 43.75 | 108 | 84.38 | 20 | 15.63 |
| මහනුවර | 254 | 6 | 2.36 | 18 | 7.09 | 75 | 29.53 | 116 | 45.67 | 215 | 84.65 | 39 | 15.35 |
| මාතලේ | 73 | 1 | 1.37 | 0 | 0 | 21 | 28.77 | 39 | 53.42 | 61 | 83.56 | 12 | 16.44 |
| නුවරඑළිය | 39 | 2 | 5.13 | 0 | 0 | 9 | 23.08 | 25 | 64.1 | 36 | 92.31 | 3 | 7.69 |
| ගාල්ල | 175 | 1 | 0.57 | 5 | 2.86 | 42 | 24 | 84 | 48 | 132 | 75.43 | 43 | 24.57 |
| මාතර | 164 | 0 | 0 | 9 | 5.49 | 54 | 32.93 | 63 | 38.41 | 126 | 76.83 | 38 | 23.17 |
| හම්බන්තොට | 95 | 1 | 1.05 | 3 | 3.16 | 27 | 28.42 | 49 | 51.58 | 80 | 84.21 | 15 | 15.79 |
| වවුනියාව | 4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4 | 100 | 4 | 100 | 0 | 0 |
| මඩකළපුව | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3 | 100 | 3 | 100 | 0 | 0 |
| අම්පාර | 63 | 0 | 0 | 1 | 1.59 | 15 | 23.81 | 28 | 44.44 | 44 | 69.84 | 19 | 30.16 |
| ත්‍රිකුණාමලය | 16 | 0 | 0 | 1 | 6.25 | 4 | 25 | 7 | 43.75 | 12 | 75 | 4 | 25 |
| කුරුණෑගල | 237 | 3 | 1.27 | 12 | 5.06 | 51 | 21.52 | 108 | 45.57 | 174 | 73.42 | 63 | 26.58 |
| පුත්තලම | 47 | 0 | 0 | 2 | 4.26 | 10 | 21.28 | 25 | 53.19 | 37 | 78.72 | 10 | 21.28 |
| අනුරාධපුර | 138 | 2 | 1.45 | 8 | 5.8 | 24 | 17.39 | 62 | 44.93 | 96 | 69.57 | 42 | 30.43 |
| පොළොන්නරුව | 41 | 1 | 2.44 | 2 | 4.88 | 11 | 26.83 | 17 | 41.46 | 31 | 75.61 | 10 | 24.39 |
| බදුල්ල | 120 | 0 | 0 | 5 | 4.17 | 33 | 27.5 | 59 | 49.17 | 97 | 80.83 | 23 | 19.17 |
| මොණරාගල | 65 | 0 | 0 | 4 | 6.15 | 15 | 23.08 | 32 | 49.23 | 51 | 78.46 | 14 | 21.54 |
| රත්නපුර | 133 | 0 | 0 | 9 | 6.77 | 49 | 36.84 | 53 | 39.85 | 111 | 83.46 | 22 | 16.54 |
| කෑගල්ල | 129 | 3 | 2.33 | 9 | 6.98 | 37 | 28.68 | 64 | 49.61 | 113 | 87.6 | 16 | 12.4 |
| සමස්ත ප්‍රතිඵලය | 2282 | 28 | 1.23 | 119 | 5.21 | 622 | 27.26 | 1058 | 46.36 | 1827 | 80.06 | 455 | 19.94 |

වගුව 3

### 1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 0 | 0.00 | 2282 | 100.00 |
| 81 - 90 | 2 | 0.09 | 2282 | 100.00 |
| 71 - 80 | 19 | 0.83 | 2280 | 99.91 |
| 61 - 70 | 107 | 4.69 | 2261 | 99.08 |
| 51 - 60 | 328 | 14.37 | 2154 | 94.39 |
| 41 - 50 | 576 | 25.24 | 1826 | 80.02 |
| **31 - 40** | **660** | **28.92** | **1250** | **54.78** |
| 21 - 30 | 411 | 18.01 | 590 | 25.85 |
| 11-20 | 159 | 6.97 | 179 | 7.84 |
| 01 - 10 | 20 | 0.88 | 20 | 0.88 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

වගුව 4

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:- 31 - 40 පන්ති ප්‍රාන්තරය සලකා බලන විට,
සිංහල විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2282 අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 660කි. එය ප්‍රතිශතයක් වශයෙන් 28.92%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 1250ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 54.78%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත. අපේක්ෂකයන් වැඩි ම සංඛ්‍යාවක් පිළිතුරු සපයා ඇත්තේ 2වන ප්‍රශ්නයට ය. එහි පහසුතාවය 88%කි. එමෙන් ම අපේක්ෂකයන් අඩු ම සංඛ්‍යාවක් පිළිතුරු සපයා ඇත්තේ 32වන ප්‍රශ්නයට ය. එහි පහසුතාවය 11%කි.


### 1.3.2 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටසෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:
සිංහල I පත්‍රයෙහි II කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් මෙම ප්‍රස්තාරයට අනුව අංක 1 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 89.43%ක් වේ. අඩුම අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරාගෙන ඇත්තේ 5වන ප්‍රශ්නය වන අතර එය ප්‍රතිශතයක් ලෙස 71.32%කි.

**ප්‍රස්තාරය** 2 (RD/16/2/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)


### 1.3.3 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටසෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:
අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න් මෙම ප්‍රස්තාරයට අනුව 76% - 100% අතර එනම් ලකුණු 16 - 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 4.64%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% අතර ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 00 - 05 තෙක් ලබා ගත් ප්‍රතිශතය 45.57%කි.

**ප්‍රස්තාරය** 3 (RD/16/2/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)


## 1.3.4 I ප්‍රශ්න පත්‍රය (IIවන කොටස) සඳහා සාධනය




**ප්‍රස්තාරය 4** (RD/16/4/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයට අනුව අංක 4 ප්‍රශ්නයෙහි (i) කොටසෙහි පහසුතාව 88%කි. අඩු ම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (iv) කොටසෙහි (අ) අනුකොටසට සහ (v) කොටසෙහි (ආ) අනුකොටසට ය. එම අනුකොටස්වල පහසුතාව 11%කි.

### 1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:

මෙහි මුල් ප්‍රශ්න 4ට පිළිතුරු සැපයීම අනිවාර්ය වුව ද 1වන ප්‍රශ්නය සඳහා 95%ක් ද, 2වන ප්‍රශ්නය සඳහා 91%ක් ද, 3වන ප්‍රශ්නය සඳහා 72%ක් ද, 4වන ප්‍රශ්නය සඳහා 64%ක් ද පිළිතුරු සපයා ඇත. අංක 5,6,7 ප්‍රශ්න අතුරෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. අංක 5 ප්‍රශ්නය සඳහා 39%ක් ද අංක 6 හා 7 ප්‍රශ්න සඳහා පිළිවෙළින් 6%ක් හා 16%ක් වශයෙන් පිළිතුරු සපයා ඇත.

ප්‍රස්තාරය 5 (RD/16/2/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

### 1.3.6 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:

අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න් මෙම ප්‍රස්තාරයට අනුව 76% - 100% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 16 -20 අතර ලබා ගත් ප්‍රතිශතය 3%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 - 5 අතර ලබා ගත් ප්‍රතිශතය 63% කි.

ප්‍රස්තාරය 6 (RD/16/2/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

## 1.3.7 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය 7** (RD/16/4/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයට අනුව අංක 4 ප්‍රශ්නයේ (අ) කොටසෙහි පහසුතාව 68%කි. එමෙන් ම අඩු ම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (ii) කොටසෙහි (ආ) අනුකොටසට ය. එහි පහසුතාව 7%කි.

## II කොටස

## 2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**I පත්‍රය** - කාලය : පැය **03** යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

I කොටස - වරණ 4 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40කි.** ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් ලකුණු 40කි.

II කොටස - මෙම කොටස ප්‍රශ්න **පහකින්** සමන්විත ය. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටස සඳහා ලකුණු 80කි.

1 ප්‍රශ්නය : කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

2 ප්‍රශ්නය : රචනය : ලකුණු 25කි. (ව්‍යුහගත තේමා 4ක් අතුරෙන් එකක් තෝරා ගත යුතු ය.)

3 ප්‍රශ්නය : සාරාංශකරණය : ලකුණු 10කි.

4 ප්‍රශ්නය : අවබෝධය : ලකුණු 10කි.

5 ප්‍රශ්නය : ප්‍රායෝගික ලේඛනය : ලකුණු 15කි. (වෛකල්පික ප්‍රශ්න කොටස් **දෙකකින්** ප්‍රශ්න **එකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

I පත්‍රය සඳහා මුළු ලකුණු = 40 + 80 = 120

## 2.1.2 I ප්‍රශ්න පත්‍රය - I කොටස

- අංක 1 සිට 3 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප පිළිතුර තෝරන්න.

1. කීයක් හරි ඉතුරු කර ගත්ත නිසා තමයි **නහින දෙහින කාලෙ** කාටවත් අත නොපා ජීවත් වෙන්නෙ යැයි ඔහු නිකර ආඩම්බරයෙන් පැවසී ය.
   (1) අගහිඟකම් ඇති කාලයේ (2) මහලු වියේ
   (3) රෝගී සමයේ (4) අභාග්‍ය සම්පන්න කාලයේ

2. රාත්‍රි අන්තිම බසය ද පිටත් ව ගොස් ඇති බව දැන ගත් ඔහු **අන්දමන්ද ව** සිටියේ නිවසට යන විදියක් ගැන සිතමින් ය.
   (1) අතරමං ව (2) සිහි මුළාවට පත් ව
   (3) කණගාටුවට පත් ව (4) කර කියා ගත හැකි දෙයක් නැති ව

3. එයාගෙ **නරිවාදත්** අහන්න මම නම් ආයෙ එහෙ යන්නෙ නැහැයි අම්මා කීවා ය.
   (1) පුරසාරම් (2) බැණ වැදීම්
   (3) ලැජ්ජා නැති කතා (4) ඔප දූප කතා

4. සෑම පදයක ම අන්තඃස්ථාක්ෂරයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
   (1) ද්වීප, සහස්‍ර, තාල, පර්‍ය (2) පහණ, ගෙවූයන, ප්‍රස්තාව, පීඨය
   (3) තරිඳු, විශේෂ, ශාක්‍ය, පතාක (4) චූඩාමණී, චාලක, භූෂණ, ප්‍රවීණ

5. පහත දැක්වෙන පදවල මුල් අකුරෙහි පිළිවෙළින් ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය, ඇලපිල්ල යෙදී ඇති වරණය තෝරන්න.
   (1) මිණිපලඟ, හූලවාලි, ශ්‍රැතිගෝචර, ශාස්ත්‍රාභිලාෂී
   (2) වීමංසා, ක්‍රෑර, දැළිරැවුල, ප්‍රාමාණික
   (3) නිමේෂය, පූර්වාචාර්යයී, බැමිණිටියාසාය, මාර්ගස්ථ
   (4) පීඨාධිපති, තණ්ණිම්හුත, ඡායාරූප, කැණිමඬල

6. පහත දැක්වෙන පදවල අවසාන අකුර තාලුජ, මූර්ධජ, දන්තජ, ඕෂ්ඨජ වශයෙන් පිළිවෙළින් යෙදී ඇති වචන පේළිය කුමක් ද?
   (1) ද්විජ, ද්විගුණ, ද්විතීය, ද්වීප (2) පරදේශ, පරමායුෂ, පරසතු, පරමාත්ම
   (3) පඞ්කජ, පඤ්චාංග, පඤ්චාල, පශ්චිම (4) නිදරුණ, නින්නාද, නිපාතන, නිතඹ

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) සහස්‍ර, ශත සහස්‍ර, පඤ්ච සහස්‍ර, දශ සහස්‍ර
   (2) අපා, දෙපා, සිවුපා, බහුපා
   (3) අර්ධ මාසික, ත්‍රෛමාසික, ද්විමාසික, මාසික
   (4) පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික, ද්විතීයික, තෘතියික

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) පරිවර්ථනය, ආශ්වාදය, ප්‍රදර්ශනය, ඥානය (2) විස්මයජනක, ප්‍රචණ්ඩ, වික්ෂිප්ත, උද්ඝෝෂන
   (3) ආභාෂය, දුර්ලභ, මර්ධනය, අත්‍යවශ්‍ය (4) මද්‍යසාර, කොට්ඨාසය, පෞරුෂය, නීත්‍යනුකූල

9. පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියා පදවල ධාතු ප්‍රකෘති නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න

   බොහෝ වේලා ආහාර **පිසීමෙන්** එහි පෝෂණ ගුණ විනාශ **වී** යන බව ප්‍රශ්නයට පිළිතුරු **දෙමින්** උපදේශිකාව ගෘහණියන්ට පැහැදිලි **කළා** ය.

   (1) පිස, ව, දෙ, කර (2) පි, ව, දෙ, කළ
   (3) පිස්, වී, දෙන, කර (4) පිසි, ව, දේ, කළ

10. ඒකවචන උක්ත පද දෙකක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) දාර්ශනිකයෝ, වෙළෙන්දකු, වාහකයෝ, ප්‍රභුවරයා
(2) ගොවියෙක්, නිලධාරියකු, ලිපිකරුවෝ, කර්තෘහු
(3) ඇදුරුතුමා, ප්‍රවීණයකු, කවීකයෝ, සතෙක්
(4) ගෘහණියක, ඡන්දදායකයෝ, භික්ෂුවක්, දේශාටකයකු

11. මුලින් දැක්වෙන සන්ධි වර්ගවලට ගැළපෙන නිදසුන් පමණක් ඇති වරණය තෝරන්න.

(1) ආගම සන්ධිය – නිරාකුල, වියවුල්, මහියංගන, පත්තිරු
(2) පූර්වරූප සන්ධිය – සන්නස්, ඇත්තල, කම්මල, ඇතැම්මු
(3) ස්වරාදේශ සන්ධිය – කාවෙ‍ය්‍යාක්ති, ගජේන්ද්‍ර, සිද්ධාලේප, දිනිඳු
(4) පරස්වර ලෝප සන්ධිය – පණකුරු, සීමාන්තික, බුදුකුරු, සදෙව්

12. පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති රූප අනුපිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරන්න.

**වෛද්‍ය** සායනයේ දී **රෝගීන්ට** නිකුත් කළ **අංක** පිළිවෙළට ඔවුන් අනුන් ගන්වන ලෙස **වෛද්‍යවරයා** විසින් ලිපිකරුවාට උපදෙස් ලබා දී තිබුණි.

(1) කර්ම විභක්ති, කර්තෘ විභක්ති, සම්ප්‍රදාන විභක්ති, ආධාර විභක්ති
(2) ආධාර විභක්ති, සම්ප්‍රදාන විභක්ති, කර්තෘ විභක්ති, කර්ම විභක්ති
(3) සම්ප්‍රදාන විභක්ති, කර්ම විභක්ති, කර්තෘ විභක්ති, ආධාර විභක්ති
(4) ආධාර විභක්ති, කර්ම විභක්ති, කර්තෘ විභක්ති, සම්ප්‍රදාන විභක්ති

13. මුලින් දී ඇති සමාස වර්ගයට ඇතුළත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) ද්වන්ද්වාර්ථ සමාසය – රෙදිපිළි, දඹුමුගුරු, සොත්පත්, කෙත්වතු
(2) විශේෂණ සමාසය – පාසියුම්, පන්සිල්, සඳවත, කළුකොඩි
(3) අන්‍යාර්ථ සමාසය – පන්හිඳ, නැගෙනහිර, පසැස්, අකාරාදිය
(4) විභක්ති සමාසය – හිරවරණ, ගුරුපඬුරු, අනාචාර, සොරබිය

14. තද්ධිත නාමයක් ඇතුළත් නොවන වාක්‍යය තෝරන්න.

(1) අන්ධ පුද්ගලයා රාත්‍රි කාලයේ එළියක් රැගෙන යන්නේ ඇස් පෙනෙන අන්‍යයන් උදෙසා ය.
(2) අන්තර් විද්‍යාලයීය ක්‍රීඩා තරග පැවැත්වීම පිළිබඳ ව ක්‍රීඩා උපදේශකයෝ සාකච්ඡා කරමින් සිටිති.
(3) අපරාධ මැඩලීමට පොලිසියට ජනතා සහාය අවශ්‍ය වේ.
(4) විහාරස්ථ දායක සභාවේ මීළඟ මහා සභා රැස්වීම ලබන සෙනසුරාදා පැවැත්වේ.

15. පහත සඳහන් වාක්‍ය අතරින් නිපාත පද තුනක් සහිත වාක්‍යය තෝරන්න.

(1) අලුත් අවුරුදු උත්සවය අවසානයේ සංවිධායකයන් විසින් සංගීත සංදර්ශනයක් ද සූදානම් කොට තිබිණි.
(2) හදිසි නඩත්තු කටයුත්තක් සඳහා නගරයේ ජල සැපයුම සඳුදා තෙක් අත්හිටුවා තිබේ.
(3) ශාක ආහාර පරිභෝජනය කරන්නන් අතර හෘදයාබාධ හා පිළිකා රෝග ඇති වීමේ ප්‍රවණතාව අඩු ය.
(4) සතුන් හා ශාක පිළිබඳ දැනුම ද කාලගුණය පිළිබඳ දැනුම ද ආදි මිනිසුන් සතු ව පැවතුණි.

16. මුලින් දී ඇති කෘදන්ත පදවලට නොගැළපෙන උදාහරණයක් සහිත පද පේළිය තෝරන්න.

(1) කර්තෘකාරක කෘදන්ත – බට, ඉගිලුණු, පිරිනැමූ, විඳින
(2) කරණකාරක කෘදන්ත – අඳනය, ලියනය, බණනය, පිස්නාව
(3) භාවකාරක කෘදන්ත – පෙළීම්, පැසසිලි, පිසමන්, බැඳීම්
(4) කර්මකාරක කෘදන්ත – බැලුණු, පිරිනැමෙන, පැරුණු, ඉහිරුණු

17. ග්‍රාම සංවර්ධන සමිතිය නියෝජනය කරමින් සභාව අමතා කතා කළ එහි සභාපති, අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් තත්ත්වය ඉහළ නැංවීමට රැකියා විරහිත තරුණයන්ට ස්වයං රැකියා ව්‍යාපෘතියට දායක වන්නැ යි ආරාධනයක් කළේය.

ඉහත වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියා පද පිළිවෙළින් දැක්වෙන පද පේළිය කුමක් ද?

(1) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධාන ක්‍රියා

(2) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අපර ක්‍රියා, විධාන ක්‍රියා

(3) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, විධාන ක්‍රියා

(4) මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, විධාන ක්‍රියා, පූර්ව ක්‍රියා

18. පහත දී ඇති වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණ අංග පිළිවෙළින් දැක්වෙන පද පේළිය තෝරන්න.

නැටුම් ගුරුවරිය විසින් පුහුණු කරන ලද නර්තනයක් ශිෂ්‍යාවන් ලවා වේදිකා ගත කරවීමට විදුහල්පතිතුමා බලාපොරොත්තු වෙයි.

(1) උක්ත කර්තෘ, අනුක්ත කර්මය, අනුක්ත කර්තෘ, ප්‍රයෝජක කර්තෘ

(2) අනුක්ත කර්තෘ, අනුක්ත කර්මය, ප්‍රයෝජක කර්තෘ, උක්ත කර්තෘ

(3) අනුක්ත කර්තෘ, ප්‍රයෝජක කර්තෘ, උක්ත කර්තෘ, අනුක්ත කර්මය

(4) ප්‍රයෝජක කර්තෘ, උක්ත කර්තෘ, අනුක්ත කර්මය, අනුක්ත කර්තෘ

19. වෙල් එළියේ කෙළිදෙළෙන් පසු වූ මගේ මිතුරෝ මා එතැනට කැඳවූහ.

ඉහත වාක්‍යය කර්මකාරකයට හැර වූ විට නිවැරදි වාක්‍යය වන්නේ මින් කුමක් ද?

(1) වෙල් එළියේ කෙළිදෙළෙන් පසු වූ මගේ මිතුරන් විසින් මම එතැනට කැඳවනු ලැබීමි.

(2) වෙල් එළියේ කෙළිදෙළෙන් පසු වූ මගේ මිතුරන් විසින් මම එතැනට කැඳවනු ලබමි.

(3) වෙල් එළියේ කෙළිදෙළෙන් පසු වූ මගේ මිතුරෝ මා එතැනට කැඳවන ලදහ.

(4) වෙල් එළියේ කෙළිදෙළෙන් පසු වූ මගේ මිතුරන් විසින් මා එතැනට කැඳවනු ලැබීමි.

20. පහත ගී ඛණ්ඩයන්හි තද කළු අකුරින් මුද්‍රිත පද ව්‍යාකරණානුකූල ව හැඳින්වෙන නම් පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

- රත්මලක් ලෙස දෙව්බඹුන් දෝතින් පිදූ මේ පින් බිමේ
- ඉරහඳ පායන ලෝකේ ආලෝකය අතරේ
- පීනමූකෝ කළුගඟේ කිරි බැබැළෙන හඳපානේ
- වක්කඩ ළඟ දිය වැටෙන තාලයට තිත්ත පැටවු උඩ පැන නැටුවා

(1) සමාස, සන්ධි, ආඛ්‍යාත, කෘදන්ත (2) සන්ධි, සමාස, කෘදන්ත, ආඛ්‍යාත

(3) සන්ධි, සමාස, ආඛ්‍යාත, කෘදන්ත (4) කෘදන්ත, සමාස, සන්ධි, ආඛ්‍යාත

21. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) 'ඕ තොමෝ' යන්න ගෞරවාර්ථ බහුවචන පදයකි.

(2) සංශයාර්ථය දැක්වෙන වාක්‍යාංශයක උක්තය ප්‍රථමා විභක්ති ගනී.

(3) වර්තමාන කෘදන්ත පද සමග යෙදෙන නකාරය දන්තජ වේ.

(4) එකම කර්තෘහුගේ අවසාන ක්‍රියාවට පෙර කරනු ලබන ක්‍රියා අපර ක්‍රියා ලෙස හැඳින්වේ.

- අංක 22 සිට 24 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

22. සම්මාන දිනූ කෙටිකතාව සඳහා රචකයාගේ ................. වී ඇත්තේ ඔහු කුඩා කල සිදු වූ සිද්ධියකි.

(1) අනුකරණය (2) අනුමානය (3) අනුවාදය (4) අද්දැකීම

23. බුද්ධාගම සිංහල සංස්කෘතිය හා බැඳුණු ................ සම්බන්ධතාවක් පුරාණයේ සිට මෙරට පැවති බව දේශකයා අවධාරණය කළේය.

(1) අවිනිශ්චිත (2) අවියෝජනීය (3) ආවස්ථික (4) ආවේණික

24. කොමිෂමේ දී ඉදිරිපත් වූ සාක්ෂි ................ කොට අවසන් වාර්තාව සකස්කොට තිබේ.

(1) සමාලෝචනය (2) සමානුපාතික (3) සමාරෝපණය (4) සම්මත

● අංක **25** හා **26** ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

25. (1) කළමනාකාරවරයා ද සේවකයා ද මවිසින් කැඳවනු ලැබීම්.
(2) විදේශිකයන් රටක් ආක්‍රමණය කළ විට ඔවුහු තම සංස්කෘතිය එහි පතුරුවා හරිති.
(3) දෙමව්පියන් අවසර දෙත් නම් ශිෂ්‍යයෝ චාරිකාව යාමට කැමති වෙති.
(4) උත්සාහවන්තයෝ අභියෝග ජයගනිතියි ගුරුතුමිය කීවා ය.

26. (1) ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව රිය අනතුරින් තුවාල ලැබූහ.
(2) පයින් යන්නෝ පාරේ දකුණුපසින් යා යුතුය.
(3) සංස්කෘතික සංදර්ශනය සංවිධානය කළේ ගැමියෝ ය.
(4) මහාචාර්ය සරච්චන්ද්‍ර විශිෂ්ට ගණයේ නාට්‍ය ශිල්පියෙක් විය.

● අංක **27** සහ **28** ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

27. භාණ්ඩාගාරික මහතා සමිතියේ සියලු ගනුදෙනු **පාරදෘශ්‍යභාවයකින්** යුතු ව කර ඇති බව ප්‍රකාශ කළේ ය.

(1) ඇසට නොපෙනෙන ආකාරයකින් (2) දුරදිග බැලීමකින්
(3) හොඳින් සිතා බැලීමකින් (4) පැහැදිලි අවබෝධයකින්

28. තමා ඉදිරිපත් කළ යෝජනාව **ඒකච්ඡන්දයෙන්** සම්මත වීම ගැන සභාපතිවරයා සතුට පළ කළේය.

(1) එක් වැඩි ඡන්දයකින් (2) බහුතර ඡන්දයෙන්
(3) සියලුදෙනාගේ කැමැත්තෙන් (4) එකකට වැඩි ඡන්ද ප්‍රමාණයකින්

● අංක **29** සහ **30** යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස තෝරන්න.

29. ගහන හෙණේ පැණිවරකාවටත් වදී.

(1) හෙණ වදින්නේ පැණි වරකා ගස්වලට පමණි.
(2) කර්ම විපාකය උස් පහත් භේදය නොසලකයි.
(3) කර්මයක් නැති ව විපාකයක් ලැබෙන්නේ නැත.
(4) පැණිවරකා ගස්වලට හෙණවල ආකර්ෂණයක් පවතී.

30. බාගෙන කන්න තිබුණු වළ ඉහගෙන කෑම.

(1) වැඩි ප්‍රයෝජන ලබන්නට ගොස් තිබුණු ටිකත් නැතිවීම.
(2) බාගෙන කෑමට වඩා ඉහගෙන කෑම පහසු ය.
(3) බාගෙන කෑවත් ඉහගෙන කෑවත් ප්‍රතිඵලය එක ම ය.
(4) වැඩි ප්‍රයෝජන ලැබෙන්නේ ඉහගෙන කෑමෙන් ය.

31. කොහොමින් කොහොමින් හරි එයත් ඇවිල්ල යස අගේට කර ගෙන ගිය වැඩේ කැඳ හැළියක් කළා.

ඉහත ප්‍රකාශය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වාක්‍යය වන්නේ,

(1) සෙමින් සෙමින් ඔහුත් පැමිණ ක්‍රමානුකූල ව වැඩ අවුල් කළේය.

(2) කෙසේ හෝ ඔහු ද පැමිණ ක්‍රමානුකූල ව කර ගෙන ගිය කාර්යය අවුල් කළේය.

(3) කෙසේ හෝ ඔහු ද පැමිණියේ ක්‍රමානුකූල ව කර ගෙන ගිය කාර්යය අවුල් කිරීමට ය.

(4) කෙසේ හෝ ඔහුත් පැමිණ හොඳ පිළිවෙළට පටන් ගත් වැඩ අවුල් කළේය.

32. එකිනෙකට අනුරූප ලෙස වචන යුගල යෙදී ඇති පද පෙළිය තෝරන්න.

(1) පාරම්පරික සිරිත්, ජාතික ක්‍රීඩා, අභ්‍යාස විද්‍යාලය, පින් කෙත

(2) නියමු ව්‍යාපෘතිය, ප්‍රතිඵල ලේඛනය, යුද භූමිය, රාත්‍රී යාමය

(3) සම්බුදු සසුන, ඇමති මණ්ඩලය, ස්වාභාවික සෞන්දර්යය, ප්‍රීතිමත් ජීවිතය

(4) කනිෂ්ඨ ශූරතාව, දිය දහර, ගෘහ ප්‍රවේශය, රෝ බිය

33. මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පෙළිය තෝරන්න.

(1) ප්‍රසිද්ධ – පතළ, පසිඳු, පුවතර, ප්‍රකට
(2) නිරතුරු – නිති, නිරන්තර, සතත, නිබඳ
(3) සිංහ – මිගිඳු, කෙසර, සී, සිහ
(4) නෙළුම් – පියුම්, සියපත, කමල, කුමුදු

34. මේ අතුරෙන් විරුද්ධාර්ථ පද යුගලයක් නොවන්නේ කුමක් ද?

(1) අනුගාමික – අනුක්‍රමික
(2) කාමභෝගී – වීතරාගී
(3) ආගන්තුක – නේවාසික
(4) සංකුචිත – ප්‍රසාරිත

35. යුගල පදයක් ඇතුළත් නොවන පද පෙළිය කුමක් ද?

(1) ගුණදොස්, කුලමල, කුදුමහත්, දුරබැහැර

(2) නඩුහබ, තළාපෙළා, තාන්නමාන්න, රෙදිපිළි

(3) ඇඳකුද, නිම්හිම්, ගම්බිම්, පින්පෙත්

(4) වතගොත, වැඳුම්පිදුම්, වෙදහෙදකම්, වසවිස

36. නිරිඳු සඳ එබසට
බෝසත්හු මුව තඹරට
සියනෙත් බිඟු විහිට
එසඳ පැවසී තෙපුල් මෙලෙසට

මෙම කවියෙහි 'මුවතඹරට' යන්න

(1) ස්වභාවෝක්ති අලංකාරය කි.
(2) රූපකාලංකාරය කි.
(3) උපමාලංකාරය කි.
(4) අතිශයෝක්ති අලංකාරය කි.

37. නියමිත අක්ෂර හෙවත් මාත්‍රා ප්‍රමාණයකට අනුව පද බැඳීමෙන් අවස්ථානුකූල ව රසය ඇති කරන්නේ

(1) රිද්මයයි.
(2) අනුප්‍රාසයයි.
(3) වෘත්තයයි.
(4) එළිසමයයි.

38. සද්ධර්මරත්නාවලිය
සද්ධර්මාලංකාරය
සද්ධර්මරත්නාකරය
පන්සිය පනස් ජාතකය

*A* – කුරුණෑගල යුගය, *B* – කෝට්ටේ යුගය, *C* – දඹදෙණි යුගය, *D* – ගම්පොළ යුගය,

ඉහත සඳහන් කෘති හතර රචිත යුග පිළිවෙළ විය යුත්තේ,

(1) *C, B, A, D* (2) *C, D, B, A* (3) *A, B, C, D* (4) *B, D, C, A*

39. සමතොළ මුහුළ මහ සමුදුර මෙවුල් බර
සුලකළ පුවළ ලකඟන සිරි යොවුන් වර
තරකළ විසල් වාසල් යතුරු මෙනු වර
බැඳ හළ රුවන් තනපට කියෙළිය පවුර

ඉහත පද්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කාව්‍යාපක්‍රම හැඳින්වෙන නම් අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) රූපක, රූපක, රූපක, උපමා
(2) රූපක, රූපක, උපමා, උපමා
(3) උපමා, රූපක, රූපක, උපමා
(4) උපමා, රූපක, උපමා, රූපක

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන නිවැරදි වාක්‍යය තෝරන්න.

පැරණි සිංහල කවි සමය බැහැර කළවුන් ලෙස හැඳින්වෙන තරුණ කවීන් පද්‍ය සිංහලයට නව පණක් දීමට කළ උත්සාහය ක්‍රමයෙන් දියුණු නොවූයේ විචාර බුද්ධිය වගා කරන්නන් ඔවුන් අතර හිඟ වූ හෙයිනි.

(1) පැරණි සිංහල කවි සමය බැහැර කොට පද්‍ය සිංහලයට පුනර්ජීවයක් දීමට තරුණ කවීන් තැත් කළේ විචාර බුද්ධිය වගා කිරීමට පෙර ය.

(2) පැරණි සිංහල කවි සමය වෙනුවට පද්‍ය සිංහලයට පුනර්ජීවය දීමට ගත් උත්සාහය විචාර බුද්ධිය වර්ධනය නොකළ නිසා දියුණු නොවීය.

(3) පැරණි සිංහල කවි සමය වෙනුවට පද්‍ය සිංහලයට පුනර්ජීවයක් දීමට තැත් කළ ද තරුණ කවීන්ගේ උත්සාහය අසාර්ථක වූයේ ඔවුන් විචාර බුද්ධිය වගා කරමින් සිටි නිසා ය.

(4) පැරණි සිංහල කවි සමය බැහැර කළ තරුණ කවීන් පද්‍ය සිංහලයට පුනර්ජීවයක් දීමට ගත් උත්සාහය ක්‍රමයෙන් දියුණු නොවූයේ ඔවුන් විචාර බුද්ධියෙන් හීන වූ නිසා ය.

**

**2.1.3 I ප්‍රශ්න පත්‍රයේ I කොටස සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 21. | 3 |
| 02. | 4 | 22. | 4 |
| 03. | 1 | 23. | 2 |
| 04. | 1 | 24. | 1 |
| 05. | 3 | 25. | 2 |
| 06. | 2 | 26. | 4 |
| 07. | 3 | 27. | 2 |
| 08. | 4 | 28. | 3 |
| 09. | 1 | 29. | 2 |
| 10. | 3 | 30. | 1 |
| 11. | 2 | 31. | 2 |
| 12. | 2 | 32. | 4 |
| 13. | 4 | 33. | 4 |
| 14. | 1 | 34. | 1 |
| 15. | 3 | 35. | 3 |
| 16. | 1 සහ 4 | 36. | 2 |
| 17. | 2 | 37. | 3 |
| 18. | 2 | 38. | 2 |
| 19. | 1 | 39. | 1 |
| 20. | 3 | 40. | 4 |

වගුව 5


නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 කි.

### 2.1.4 I ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - තේමා අනුව

I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා හතරකි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය පහත වගුවේ සඳහන් කර ඇත.

| තේමාව | ප්‍රශ්න අංකය |
|---|---|
| භාෂා කුසලතා | 1,2,3,22,23,24,27,28,29,30,31,32,33,34,35 |
| ව්‍යාකරණ | 4,5,6,7,8,9,10,11,12,13,14,15,16,17,18,19,20,21,25,26 |
| භාෂා සාහිත්‍යය | 36,37,38,39 |
| විශ්ලේෂණය හා අවබෝධය | 40 |

වගුව 6





ප්‍රස්තාරය 8

භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න 15 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය 2වන ප්‍රශ්නය වේ. එය I ප්‍රශ්න පත්‍රයේ ම පහසුම ප්‍රශ්නය ද වේ. I පත්‍රයේ පහසුතාව අඩුම ප්‍රශ්නය වන්නේ ද භාෂා කුසලතා තේමාව යටතේ ම ඇති 32වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 11.41%කි. භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් 50%ක් හෝ ඊට වැඩි පහසුතාවක් ඇති ප්‍රශ්න 5කි. එම ප්‍රශ්න වන්නේ 2,22,28,29,30 යන ප්‍රශ්නයි.

ව්‍යාකරණ තේමාව යටතේ ඇති ප්‍රශ්න 20 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ 5වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 82.88%කි. මෙම තේමාව යටතේ පහසුතාව අඩුම ප්‍රශ්නය වන්නේ 21වන ප්‍රශ්නයයි. එහි පහසුතාවය 21.40%කි. ව්‍යාකරණ තේමාව යටතේ ඇති ප්‍රශ්න 20 අතුරෙන් 50%ක් හෝ ඊට වැඩි පහසුතාවක් පෙන්වන ප්‍රශ්න 04ක් ඇති අතර එම ප්‍රශ්න අංක වනුයේ 5,7,9 හා 16 යි.

භාෂා සාහිත්‍යය තේමාව යටතේ ප්‍රශ්න 04ක්ද විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ එක් ප්‍රශ්නයක් ද ඉදිරිපත් කර ඇත.




ප්‍රස්තාරය 8 I

සිංහල I පත්‍රයෙහි I කොටස සැකසීමේ දී පදනම් කර ගනු ලැබූ තේමා 4 අතුරෙන් එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතා සලකා එම එක් එක් තේමාවෙහි මධ්‍යක පහසුතාව මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. ඒ අනුව එම තේමා අතුරෙන් පහසුතා වැඩි ම ප්‍රශ්නය භාෂා කුසලතාව තේමාව යටතේ ඇතුළත් දෙවන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 88%කි. පහසුතාව අඩු ම ප්‍රශ්නය වන්නේ ද එම තේමාව යටතේ ම ඇති අංක 32 ප්‍රශ්නයයි. එහි පහසුතාව 11%කි. සමස්ත වශයෙන් I පත්‍රයෙහි මධ්‍යක පහසුතාව 44%කි.

| තේමාව | පහසුතාව වැඩි ම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩු ම ප්‍රශ්නය හා එහි පහසුතාව |
|---|---|---|
| භාෂා කුසලතා | 2 (88%) | 32 (11%) |
| ව්‍යාකරණ | 5 (83%) | 21 (21%) |
| භාෂා සාහිත්‍යය | 38 (64%) | 39 (22%) |
| විශ්ලේෂණ හා අවබෝධය | 40 (55%) | - |

වගුව 6

### 2.1.5 I ප්‍රශ්න පත්‍රයේ I කොටසේ වරණ තෝරා ගෙන ඇති ආකාරය (ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිව්වන වරණය | ප්‍රතිචාර නොදැක්වූ |
| 1 | 2 | 51.07 | 40.37 | 2.43 | 5.42 | 0.71 |
| 2 | 4 | 4.56 | 4.56 | 3.14 | 87.73 | 0.01 |
| 3 | 1 | 47.50 | 14.27 | 23.11 | 14.98 | 0.14 |
| 4 | 1 | 23.97 | 40.94 | 18.97 | 13.12 | 3.00 |
| 5 | 3 | 5.56 | 4.85 | 82.88 | 6.70 | 0.01 |
| 6 | 2 | 30.67 | 46.08 | 10.84 | 10.70 | 1.71 |
| 7 | 3 | 4.14 | 34.38 | 55.49 | 5.14 | 0.85 |
| 8 | 4 | 24.96 | 15.12 | 29.24 | 29.96 | 0.72 |
| 9 | 1 | 54.35 | 11.55 | 20.11 | 13.55 | 0.44 |
| 10 | 3 | 18.97 | 28.96 | 28.82 | 22.54 | 0.71 |
| 11 | 2 | 16.12 | 30.96 | 24.54 | 27.67 | 0.71 |
| 12 | 2 | 17.12 | 40.94 | 23.25 | 18.54 | 0.15 |
| 13 | 4 | 18.40 | 19.97 | 29.81 | 31.67 | 0.15 |
| 14 | 1 | 24.82 | 18.97 | 35.09 | 20.54 | 0.58 |
| 15 | 3 | 19.54 | 13.27 | 22.68 | 44.37 | 0.14 |
| 16 | 1,4 | 32.24 | 30.53 | 18.26 | 18.54 | 0.43 |
| 17 | 2 | .9.56 | 45.65 | 31.10 | 13.69 | 0.00 |
| 18 | 2 | 27.67 | 38.09 | 24.11 | 9.42 | 0.71 |
| 19 | 1 | 25.39 | 20.68 | 25.96 | 27.82 | 0.15 |
| 20 | 3 | 15.83 | 34.95 | 35.95 | 12.41 | 0.86 |
| 21 | 3 | 34.52 | 14.27 | 21.40 | 29.39 | 0.42 |
| 22 | 4 | 15.83 | 8.13 | 13.55 | 62.48 | 0.01 |
| 23 | 2 | 6.99 | 32.81 | 6.56 | 53.50 | 0.14 |
| 24 | 1 | 43.65 | 3.28 | 2.14 | 50.64 | 0.29 |
| 25 | 2 | 10.98 | 28.82 | 27.10 | 33.10 | 0.00 |
| 26 | 4 | 10.98 | 38.80 | 20.26 | 29.67 | 0.29 |
| 27 | 2 | 5.99 | 30.10 | 13.84 | 49.79 | 0.28 |
| 28 | 3 | 20.97 | 11.41 | 50.07 | 17.40 | 0.15 |
| 29 | 2 | 4.14 | 84.17 | 9.42 | 2.27 | 0.00 |
| 30 | 1 | 87.30 | 5.42 | 4.71 | 2.43 | 0.14 |
| 31 | 2 | 15.55 | 46.36 | 9.56 | 28.25 | 0.28 |
| 32 | 4 | 30.67 | 16.55 | 41.23 | 11.41 | 0.14 |
| 33 | 4 | 32.24 | 15.41 | 29.10 | 22.54 | 0.71 |
| 34 | 1 | 30.53 | 17.83 | 20.83 | 29.96 | 0.85 |
| 35 | 3 | 27.10 | 21.54 | 26.82 | 24.39 | 0.15 |
| 36 | 2 | 10.98 | 36.95 | 37.23 | 14.55 | 0.29 |
| 37 | 3 | 28.10 | 19.69 | 29.96 | 22.11 | 0.14 |
| 38 | 2 | 9.99 | 64.05 | 10.13 | 15.41 | 0.42 |
| 39 | 1 | 24.54 | 21.97 | 29.81 | 26.25 | 0.43 |
| 40 | 4 | 9.70 | 20.68 | 14.12 | 55.06 | 0.44 |

වගුව 7
එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

### 2.1.6 I ප්‍රශ්න පත්‍රයේ I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව පිළිබඳ අපේක්ෂකයන් සතු නිරවුල් දැනුම, ස්මරණ ශක්‍යතාව, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිත ය.

මෙම බහුවරණ ප්‍රශ්න හතළිහට ම ඒ සඳහා විශේෂයෙන් සැකසුණු ආකෘතියක පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල I පත්‍රයට හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I පත්‍රයේ ප්‍රශ්න හතළිහට පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත් පැය එකක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් යැයි අපේක්ෂා කෙරේ.

සිංහල I පත්‍රයේ අඩංගු බහුවරණ ප්‍රශ්න පත්‍රය සැකසීමේ දී භාෂා කුසලතාව තේමාවට අදාළ ව ප්‍රශ්න 15ක් ද, ව්‍යාකරණ තේමාවට අදාළ ව ප්‍රශ්න 20ක් ද, භාෂා සාහිත්‍ය තේමාවට අදාළ ව ප්‍රශ්න 04ක් ද, විශ්ලේෂණය හා අවබෝධය තේමාවෙන් එක් ප්‍රශ්නයක් ද ඇතුළත් කර ඇත.

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් ප්‍රශ්න 15ක් භාෂා කුසලතා තේමාවෙන් ඉදිරිපත් කර ඇත. 1 පත්‍රයට හිමි ලකුණුවලින් 38%ක් මේ සඳහා වෙන් කෙරෙන ලෙස තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් පහසු ම 2වන ප්‍රශ්නය වන අතර එය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 88%කි. 29,30 ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 84%,87%ක් වේ. 1 පත්‍රයේ I කොටසේ ප්‍රශ්න 40 අතුරෙන් ඉහළ ම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ ද භාෂා කුසලතා තේමාවට අයත් මෙම ප්‍රශ්න තුනයි. ඒ සෑම ප්‍රශ්නයක පහසුතාව 83% ඉක්මවා ඇත.

මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් දුෂ්කර ප්‍රශ්න බවට පත්ව ඇත්තේ අංක 27, 32, 33, 35 යන ප්‍රශ්න වන අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 30%,11%,23%,27% වේ. භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 32 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ පිළිතුරු වඩාත් අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් 4වන වරණය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 11%ක් පමණි. අපේක්ෂකයන්ගෙන් 31%ක් පළමු වරණය ද, 17%ක් දෙවන වරණය ද, 41%ක් තුන්වන වරණය ද පිළිතුරු ලෙස තෝරා ගෙන ඇත. මෙහි අංක 32 ප්‍රශ්නය යටතේ එකිනෙකට අනුරූප ලෙස වචන යුගළ යෙදී ඇති පද පේළිය තෝරා ගැනීම අපේක්ෂිත වුව ද දී ඇති පද යුගළ පිළිබඳ නිවැරදි අවබෝධයක් අපේක්ෂකයන් සතුව නොතිබූ බව ගම්‍ය වේ. ඊට හේතුව වන්නේ පෙළපොත නිසි ලෙස පරිහරණය නොකිරීමයි.

**ව්‍යාකරණ**

සිංහල I පත්‍රයෙහි I කොටසෙහි ව්‍යාකරණ තේමාවට බහුවරණ ප්‍රශ්න 20ක් අඩංගු වූ අතර මෙම ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණුවලින් 50%ක් එම තේමාවට වෙන් වී තිබුණි.

ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න 20 අතුරෙන් වැඩි ම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ 5වන ප්‍රශ්නයට ය. එහි පහසුතාව 83%කි. මෙම තේමාව යටතේ ඇති සෙසු පහසු ප්‍රශ්න ලෙස සැලකිය හැකි 7,9,16 යන ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 55%, 54%, 51%ක් වේ.

ව්‍යාකරණ තේමාව යටතේ අපේක්ෂකයන්ට දුෂ්කර ම ප්‍රශ්නය වී තිබුණේ 21වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 21%ක් පමණි. මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර තුන්වෙනි වරණය වුවත් එය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 21%ක් පමණක් වූ අතර අපේක්ෂකයන්ගෙන් 35%ක් පළමු වරණය ද 14%ක් දෙවන වරණය ද 29%ක් සිවුවන වරණය ද තෝරා ගෙන තිබුණි. ව්‍යාකරණාංගවලින් සමන්විත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තේරීම සඳහා ව්‍යාකරණ රීති පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොතිබූ බව මෙහි දී කැපී පෙනුණි.

ප්‍රශ්න අංක 4,14,15,19 ප්‍රශ්න ද අපේක්ෂකයන්ට දුෂ්කර වී ඇති බව පෙනේ. ඒවායේ පහසුතා ප්‍රතිශත පිළිවෙළින් 24%, 25%, 23%, 25%ක් වේ. සමස්තයක් ලෙස ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා ගැනීමේ මධ්‍යක පහසුතාව (Average Facility) 37%කි.

**භාෂා සාහිත්‍යය**

සිංහල I පත්‍රයේ ප්‍රශ්න 40 අතුරෙන් මෙම තේමාව ඇසුරෙන් සකස් වී ඇත්තේ ප්‍රශ්න 4ක් පමණි. එනම් අංක 36,37,38 හා 39 ප්‍රශ්නයි. මෙම ප්‍රශ්න 4 අතුරෙන් ඉහළ ම පහසුතාව ලබා තිබුණේ 38වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 64%කි. 36, 37, 39 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 37%, 30%, 22%ක් වේ.

පෙළපොතේ ඇතුළත් කාව්‍යාලංකාර හා සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නවලින් විමසා තිබුණි. සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම සඳහා වූ 38වන ප්‍රශ්නයට මනා ප්‍රතිචාර ලැබී තිබුණ ද කාව්‍යාලංකාර පිළිබඳ අවබෝධය මඳ වීම සෙසු ප්‍රශ්න සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලැබීමට හේතු වී ඇත.

මෙම ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණුවලින් 10%ක් මෙම තේමාවට වෙන් වී තිබූ අතර ඊට අදාළ ප්‍රශ්න හතරෙන් මධ්‍යක පහසුතාව (Average Facility) 38%කි.

**විශ්ලේෂණය හා අවබෝධය**


සිංහල I පත්‍රයේ විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතට අංක 40 ප්‍රශ්නය වෙන් වී තිබුණි. I පත්‍රයට හිමි ලකුණුවලින් මෙම තේමාව සඳහා 2.5%ක බර තැබීමක් සිදු කර ඇත. එම 40 වෙනි ප්‍රශ්නයේ පහසුතාව 55%කි. හොඳින් කියවා තේරුම් ගත යුතුව තිබූ එම ප්‍රශ්නයට ඉහළ පහසුතාවක් ලබා ගැනීම විශේෂත්වයකි. විශ්ලේෂණ හා අවබෝධතා හැකියාව මැනීමේ පහසුතා දර්ශකය මෙන් ම එහි මධ්‍යක පහසුතාව ද (Average Facility) 55%කි.

සිංහල I පත්‍රයෙහි සමස්ත පහසුතාව 41%කි. එනම් මෙම පත්‍රයට පෙනී සිටි අපේක්ෂකයන් සමස්තයක් වශයෙන් ගත් කළ ඔවුන් උපයා ගෙන ඇත්තේ එම පත්‍රයට උපයා ගත හැකිව තිබූ උපරිම ලකුණුවලින් 41%කි පමණි. මෙයින් පෙනී යන්නේ මෙම පත්‍රයට ලකුණු ලබා ගැනීම මධ්‍යස්ථ මට්ටමට වඩා පහළ මට්ටමක පැවති බවයි.

සිංහල I පත්‍රයේ ප්‍රශ්න අංක 2, 22, 28, 29, 30, 5, 7, 9, 16, 38, 40 යන ප්‍රශ්න 11 සඳහා ලබා ඇති පහසුතාව 50%ක් හෝ ඊට වැඩි අගයක් ගෙන තිබුණි. එය මුළු ප්‍රශ්න ගණනින් 28%කි. මුළු ප්‍රශ්න ගණනින් 28%ක් සඳහා 50%ට වැඩි පහසුතාවක් ලබා ගැනීම සතුටුදායක තත්ත්වයකි. එම ප්‍රශ්න 11න් 5ක් භාෂා කුසලතා තේමාවටද, 4ක් ව්‍යාකරණ තේමවට ද 1ක් භාෂා සාහිත්‍යය තේමාවට ද 1ක් විශ්ලේෂණ හා අවබෝධය තේමාවට ද ඇතුළත් වේ. එසේ වුව ද සමස්ත පහසුතාව 41%ක් වීම සෑහීමට පත් විය හැකි තත්ත්වයක් නොවේ.

### 2.2 I ප්‍රශ්න පත්‍රයේ IIවන කොටසේ ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.2.1 I ප්‍රශ්න පත්‍රයේ II කොටසේ එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :




**ප්‍රස්තාරය 8** (RD/16/4/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

1 ප්‍රශ්න පත්‍රයේ II කොටසෙහි ප්‍රශ්න පහට ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. අපේක්ෂකයන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ පළමුවන ප්‍රශ්නයට වන අතර අඩු ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ 5වන ප්‍රශ්නයට ය. එම ප්‍රතිශත පිළිවෙළින් 89%ක් හා 71%ක් වේ (ප්‍රස්තාරය 2 අනුව). මෙම ප්‍රශ්න පහ අතුරෙන් පළමුවන ප්‍රශ්නය සඳහා 89%ක් පිළිතුරු සපයා තිබුණ ද එම ප්‍රශ්නයෙහි පහසුතාව 30%කි. මෙම ප්‍රශ්නය සරල ව්‍යාකරණ රීතිවලින් සමන්විත වන අතර ලකුණු 20ක් හිමි වේ. එහෙත් වියරණ පිළිබඳව අපේක්ෂකයන් සතු දැනුම හා අවබෝධය අවම වීම ලකුණු අඩු වීමට හේතු ලෙස දැක්විය හැකි ය. අපේක්ෂකයන් සතු සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැනීම අරමුණු කරගත් 2වන ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි අතර එම ප්‍රශ්නයෙහි පහසුතාව 29%ක් තරම් අඩු අගයකි.

එමෙන් ම සාරාංශකරණය පිළිබඳ ව අපේක්ෂකයන් සතු සාධන මට්ටම මැනීම තුන්වන ප්‍රශ්නයේ අරමුණ වන අතර එම ප්‍රශ්නයෙහි පහසුතාව 59%කි. මේ ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

අපේක්ෂකයන් වැඩි ම සාර්ථකත්වයක් දක්වා ඇත්තේ හතරවන සහ පස්වන ප්‍රශ්නවලට ය. එම ප්‍රශ්නවල පහසුතාව 60%කි. ඡේදයක් ඇසුරෙන් සකස් කෙරෙන ප්‍රශ්න මගින් අපේක්ෂකයන් ගේ භාෂා ඥානය හා අවබෝධය මැනීම හතරවන ප්‍රශ්නයේ අරමුණ වන අතර ප්‍රායෝගික ලේඛන සැකසීමේ දී අපේක්ෂකයන් සතු කුසලතාව මැනීම පස්වන ප්‍රශ්නය මගින් සිදු වේ. එම ප්‍රශ්න සඳහා පිළිවෙළින් ලකුණු 10ක් හෝ 15ක් හිමි වේ. ඒ අනුව 3,4,5 ප්‍රශ්නවල පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතී.

## 1 ප්‍රශ්නය

**අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම**

**ව්‍යූහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනු ප්‍රශ්න දහයක් ඇතුළත් වේ.**

**1.** අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) පහත සඳහන් වර්ගවලට අයත් අකුරු සමග යෙදෙන නාසික්‍ය අක්ෂර ලියන්න.

(අ) ච වර්ගය (ආ) ට වර්ගය

(ii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.

(අ) බිත්තරයෙන් උපන්

(ආ) රාත්‍රියෙහි අන්තිම යාමය

(iii) පහත සඳහන් පද්‍ය පාඨ දෙකෙහි ඇතුළත් 'හසුන්' යන්නෙහි අර්ථ දෙක වෙන වෙන ම ලියන්න.

(අ) පිවිතුරු හසුන් එන ලෙස යළි ගෙදිගු විල

(ආ) එ හසුන් පැසුළු පවසම් රස නුසුන් කොට

(iv) (අ) 'මෛත්‍රේය' යන්නෙහි ශබ්ද ප්‍රකෘතිය හා තද්ධිත ප්‍රත්‍යය වෙන් කර ලියන්න.

(ආ) වත්සල + ය ගැළපීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) අල්පේච්ඡතාව (ආ) බේදාන්ත

(vi) පහත දක්වා ඇති අනුක්ත පදවල උක්ත රූප ලියන්න.

(අ) ඈය (ආ) ඇතැමුන්

(vii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

අයවැය ලේඛණය සකස් කිරීමේදී මතු වූ ගැටළු නිලධාරීහු සියලු දෙනා ම එක් ව සාකච්ඡා කළහ.

(viii) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍යය කර්මකාරකයටත් කර්මකාරක වාක්‍යය කර්තෘකාරකයටත් හරවා ලියන්න.

(අ) රණවිරු ස්මාරකයේ සැලැස්ම ප්‍රවීණ ශිල්පියෙක් නිර්මාණය කළේය.

(ආ) සභාපතිවරයා විසින් පාර්ශ්වකරුවෝ සමථ මණ්ඩලයට කැඳවන ලදහ.

(ix) පහත දැක්වෙන යෙදුම්වල පළමු වචනය සහ දෙවන වචනය අතර නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.

(අ) වෛද්‍ය උපදෙස් (ආ) ශිලා ලිපි

(x) පහත සඳහන් පද්‍යාර්ධවල තද කළු අකුරින් මුද්‍රිත පද කවර ක්‍රියා වර්ගයට අයත් දැයි දක්වන්න.

(අ) විඳ සව්සිරි **නඳුන්**
වනක රජ කරන රඟ **තිරිඳුන්**

(ආ) එයින්'ප රජු **පවත්**
මෙසේ අසවයි කියා **පවසත්**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) (අ) ඤ (ආ) ණ

(ii) (අ) අණ්ඩජ (ආ) පැසුළුයම / පශ්චිම යාමය / පසුයම

(iii) (අ) හංසයන් (ආ) ලිපිය / පණිවුඩය / හසුන / අස්න / හස්න

(iv) (අ) මිත්‍ර + ඒය (ආ) වාත්සල්‍යය / වාත්සල්‍ය

(v) (අ) මහිච්ඡතාව / මහේච්ඡතාව (ආ) සුඛාන්ත

(vi) (අ) ඕ / ඈ (ආ) ඇතැම්හු / ඇතැම්මු

(vii) ලේඛනය, ගැටලු

(viii) (අ) රණවිරු ස්මාරකයේ සැලැස්ම ප්‍රවීණ ශිල්පියෙකු / ශිල්පියකු විසින් නිර්මාණය කරන ලදී / කෙරිණි / කෙරිණ / කරනු ලැබීය / කරනු ලැබිණි / කරන ලද්දේය.
(ආ) සභාපතිවරයා පාර්ශ්වකරුවන් සමඟ මණ්ඩලයට කැඳවීය / කැඳවී / කැඳවූයේ ය.

(ix) (අ) වෛද්‍ය උපදේශ / වෙද උපදෙස්
(ආ) ශිලා ලේඛන / සෙල්ලිපි


(x) (අ) අසම්භව්‍ය ක්‍රියා / කල් අරුත අසබභවි / කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා / නියතාර්ථයේ ආවස්ථික ක්‍රියා
(ආ) විධි ක්‍රියා / විදිකිරිය / විධාන ක්‍රියා

**(ලකුණු 02 x 10)**

**(ලකුණු 20යි.)**

**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**





මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 89%ක පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 46%ක් ද
6 - 10 ප්‍රාන්තරයේ 36%ක් ද
11 - 15 ප්‍රාන්තරයේ 13%ක් ද
16 - 20 ප්‍රාන්තරයේ 5%ක් ද

ලකුණු ලබා ගෙන ඇත.

ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 5%ක් වන අතර 46%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩු ප්‍රමාණයකි.




සිංහල I පත්‍රයේ II කොටසෙහි පළමුවන ප්‍රශ්නය කොටස් 10ක් යටතේ අනුකොටස් 19කින් සමන්විත වේ. වැඩි ම පහසුතාව (i) (අ) අනුකොටස වන අතර එහි පහසුතාව 80%කි. මෙම ප්‍රශ්නයෙන් මැනෙන්නේ සිංහල අක්ෂර මාලාවට අයත් නාසික්‍ය අක්ෂර පිළිබඳව ය. වර්ගාක්ෂර යටතේ නාසික්‍ය අක්ෂර හඳුනා ගැනීමට අපේක්ෂකයන්ට පහසු වී ඇති නිසා ඊට ලැබුණු ප්‍රතිචාර ඉහළ මට්ටමක පැවති බව පෙනේ.

★ දෙවන වැඩි පහසුතාව වන 73% පෙන්නුම් කර ඇත්තේ (i)වන කොටසේ (ආ) අනුකොටසට ය. වර්ගාක්ෂරවල නාසික්‍යාක්ෂර පිළිබඳ මෙම ප්‍රශ්නයට අදාළ අනුකොටස් දෙකෙන් ම විමසා ඇති අතර ප්‍රාථමික ශ්‍රේණිවල සිට ම වර්ණමාලාවට අවධානය යොමු කරන බැවින් එම ප්‍රශ්නය පහසු වී ඇති බව ප්‍රකාශ කළ හැකිය.

★ තෙවන වැඩි පහසුතාව වන 46% පෙන්නුම් කරන (ii) (අ) අනුකොටස තනි පද විමසන ප්‍රශ්නයකි. බිත්තරයෙන් උපන් යන්න හැඳින්වීමට 'අණ්ඩජ' යන තනි පදය දැක්වීමට අපේක්ෂකයන්ගෙන් වැඩි පිරිසක් සමත් වී ඇත.

★ (iii) (ආ) (vi) (අ), (vii) සහ (ix) (ආ) යන කොටස්වල/ අනුකොටස්වල පහසුතාව 30% - 40% ප්‍රාන්තරය අතර පවතී. මෙම අනුකොටස් 19 අතුරෙන් දුෂ්කර ම වී ඇත්තේ (iv) (අ) සහ (v) (ආ) අනුකොටස් ය. එම අනුකොටස්වල පහසුතාව 11%කි. ඒ අනුව තද්ධිත ප්‍රත්‍යය වෙන් කර දක්වන අනුකොටසට හා විරුද්ධාර්ථ පද දක්වන අනුකොටසට සාර්ථක ව පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් අපොහොසත් වී ඇති බව පෙනේ. ව්‍යාකරණ රීති පිළිබඳව හා භාෂා භාවිතය පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීම මීට හේතුව වශයෙන් දැක්විය හැකි ය.

★ අනතුරු ව වඩාත් දුෂ්කර වී ඇත්තේ (x) (අ) අනුකොටස ය. එහි පහසුතාව 12%කි. එහි (ආ) අනුකොටසෙහි පහසුතාව 21%කි. එම කොටසෙහි අනුකොටස් දෙකෙන් ම මැනෙනුයේ ක්‍රියා වර්ග පිළිබඳ නිරවුල් අවබෝධයයි. මෙම අනුකොටස් දෙකෙහි ම පහසුතාව පහළ මට්ටමක පැවතීමට හේතුව අපේක්ෂකයන් තුළ ක්‍රියා වර්ග පිළිබඳ දැනුමෙහි පවතින දුර්වලතාව බව අනාවරණය විය.

★ (iii) කොටසේ (අ) අනුකොටස පදයක අර්ථය විමසන ප්‍රශ්නයක් වන අතර (viii) කොටසේ (අ) සහ (ආ) අනුකොටස් ව්‍යාකරණ දැනුම විමසන ප්‍රශ්නය. එම අනුකොටස් සඳහා ලබා ගෙන ඇති පහසුතාව පිළිවෙළින් 22%,22% සහ 19%ක් විය.

★ ක්‍රියාවර්ග හා උක්ත අනුක්ත පද සම්බන්ධය වැනි සරල ව්‍යාකරණ පිළිබඳ දැනුම අපේක්ෂකයන් සතුව නොමැති බවත් ව්‍යවහාරික භාෂාවේ යෙදෙන විශේෂිත පද පිළිබඳ නිරවුල් අවබෝධයක් නොමැති බවත් මෙහි දී පැහැදිලි විය. භාෂා පරිචය යටතේ ලේඛන කුසලතා, භාෂා අවබෝධය හා විශ්ලේෂණය කිරීම, භාෂා භාවිතය, ග්‍රන්ථ පරිශීලනය හා වාක්‍ය අවබෝධය යන කරුණු මැනීම මෙයින් අපේක්ෂා කළ ද අපේක්ෂකයන් තුළ ව්‍යාකරණ පිළිබඳ මූලික දැනුම හීනවීමත්, අවබෝධය පිළිබඳ දුර්වලතාත් දක්නට ලැබිණි. මේ සඳහා ව්‍යාකරණ ග්‍රන්ථ පරිශීලනයටත් ව්‍යාකරණ දැනුම වැඩි දියුණු කර ගැනීමටත් පෙළපොත් හා අමතර ග්‍රන්ථ පරිශීලනයටත් අපේක්ෂකයන් උනන්දු කරවිය යුතු ය.

2 ප්‍රශ්නය

අපේක්ෂණය : සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැනීම

ව්‍යුහය : මාර්ගෝපදේශිත රචන මූලධර්මයට අනුව සැකසී ඇති මෙම ප්‍රශ්නය සඳහා ඉදිරිපත් කොට ඇති මඟ පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලසේ.

2. පහත දැක්වෙන (i), (ii), (iii) හා (iv) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන, වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා, රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. *(ලකුණු 25 යි)*

(i) ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටකි. ක්‍රමවත් සැලැස්මක් යටතේ ගොවීන්ට අවශ්‍ය පහසුකම් සැලසුව හොත් රට ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීමටත් ගොවිජන ජීවිතය ආර්ථික වශයෙන් සුරක්ෂිත කිරීමටත් කෘෂිකර්මය විදේශ විනිමය උපයන මාර්ගයක් කොට ණය බරින් තොර සුඛිත මුදිත රටක් ගොඩනැගීමටත් අසීරු නොවේ.

(ii) කසළ ප්‍රශ්නය මෑත කාලයේ සිට මෙරට විශාල අර්බුදයක් බවට පත් වී ඇත. කසළ කඳු නිසා පසුගිය කාලයේ ජීවිත හානි සිදු වූ බවට ද වාර්තා විය. මහජන සෞඛ්‍යයට හානිකර ලෙස කසළ ගොඩ ගැසීම නිසා වන සත්තු පවා අකාලයේ මියැදුණහ. විධිමත් කසළ කළමනාකරණයක් මඟින් එය රටට විපතක් නොව සම්පතක් කර ගත හැකි ය.

(iii) ශ්‍රී ලංකාවේ අලි සම්පත විනාශ වීමේ තර්ජනයකට මුහුණ පා ඇත. පාරිසරික අධ්‍යයනයකින් තොර ව කරනු ලබන සංවර්ධන කටයුතු නිසාත් භවභෝග විනාශ කරන අලි ඇතුන් මරා දැමීමට ගොවියන් කටයුතු කරන නිසාත් දුම්රිය හා මහාමාර්ග අනතුරුවලට මුහුණ පෑම නිසාත් ඔවුන්ගේ ජීවිතවලට විශාල තර්ජනයක් එල්ල වී ඇත. එබැවින් අලි සම්පත ආරක්ෂා කර ගැනීම වගකිවයුත්තන්ගේ හා පරිසර හිතකාමී ජනතාවගේ වගකීමක් වී තිබේ.

(iv) රූපවාහිනිය තරම් විවේචනයට ලක් වූ වෙනත් මාධ්‍යයක් නැත. අඛනිරුවත් රැඟුම් සහිත සුපර් ස්ටාර් තරඟ, ඉන්දියානු හර සුන් මෙගා ටෙලි නාට්‍ය, සොරමැරකම් සහ මිනිස් ඝාතන ඇතුළත් බටහිර චිත්‍රපට, අතෝරයක් නැතිව ඉදිරිපත් කරන වෙළෙඳ දැන්වීම් ආදිය නිසා රූපවාහිනී වැඩසටහන් ප්‍රේක්ෂකයන්ගේ කාලය නාස්ති කරන මාධ්‍යයක් ලෙස චෝදනා එල්ල වේ. රූපවාහිනී වැඩසටහන් ඵලදායී හා හරවත් බවින් පරිපූර්ණ ඒවා ලෙස ඉදිරිපත් කිරීම කෙරෙහි වගකිවයුත්තන්ගේ අවධානය යොමු විය යුතු කාලය එළඹ තිබේ.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

සංස්ලේෂණ හැකියාව එනම් කිසියම් සමස්තයක් ගොඩනැගීමේ හැකියාව හා ඡේදයක විවිධ කොටස් හඳුනා ගෙන ඒ අනුකොටස් අතර නිවැරදි සම්බන්ධතාව පවත්වා ගනිමින් අලුත් යමක් නිර්මාණය කිරීමේ හැකියාව මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිත ය.

රචනා සඳහා ප්‍රධාන මඟ පෙන්වීම් හතරක් පහත සඳහන් තේමා යටතේ ඉදිරිපත් කොට ඇත.

1. රටක දිනු දයා ගොවිකම වේය දනු ශ්‍රියා
2. කසළ කළමනාකරණය
3. අලි සම්පත රැකගනිමු
4. රූපවාහිනිය හරවත් මාධ්‍යයක් කර ගැනීමට නම්......

**<u>ලකුණු ප්‍රදානය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු</u>**

ලකුණු ප්‍රදානය තේමා තුනක් යටතේ සිදු විය යුතු ය.

1. සාරවත්භාවය (මාතෘකාව ද ඇතුළුව) **(ලකුණු 12යි.)**
2. රචනා ශෛලිය හා භාෂා විලාසය **(ලකුණු 05යි.)**
3. ශිල්පීය දක්ෂතා **(ලකුණු 08යි.)**

**විස්තරයට අදාළ මාතෘකාව සඳහා** (ලකුණු 01යි.)

**සාරවත්භාවය** (ලකුණු 11යි.)

- තේමාවට අදාළ බව
- ඉදිරිපත් කර ඇති ව්‍යූහයට සමීප බව
- සාරවත් බව.
- වචන ගණන 250ට සමීප ව තිබීම

වචන සංඛ්‍යාව 350 වැඩි නම් ලකුණු 01ක් ද 200ට අඩුනම් ලකුණු 01ක් ද, අඩු කරන්න.

**රචනා ශෛලිය හා භාෂා විලාසය** (ලකුණු 05යි.)

- උසස් ප්‍රකාශන ශක්තිය
- නිර්මාණාත්මක අදහස්
- ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය

ආදිය පිළිබඳ මෙහි දී සැලකිලිමත් විය යුතු ය.

**ශිල්පීය දක්ෂතා** (ලකුණු 08යි.)


- වියරණ
- අත් අකුරු
- විරාම ලක්ෂණ
- පද බෙදා ලිවීම
- සුදුසු පරිදි ඡේද වෙන් කර ලිවීම

**(ලකුණු 25යි.)**

ආදිය මේ යටතේ අවධානයට ලක් විය යුතු ය.

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**


**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 84%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 6 ප්‍රාන්තරයේ 14%ක් ද
7 - 12 ප්‍රාන්තරයේ 16%ක් ද
13 - 18 ප්‍රාන්තරයේ 51%ක් ද
19 - 25 ප්‍රාන්තරයේ 19%ක් ද

ලෙසින් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රමාණය 30%කි. 19 - 25 අතර ලකුණු ලබා ගත් ප්‍රමාණය 19%කි. සමස්තයක් වශයෙන් ගත් කළ රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම දුර්වල මට්ටමක පැවතිණි.




මෙම ප්‍රශ්නයෙහි (i),(ii),(iii),(iv) පිළිවෙළින් ක්‍රමවත් සැලැස්මක් යටතේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමේ අවශ්‍යතාව, විධිමත් කසළ කළමණාකරණය, අලි සම්පත ආරක්‍ෂා කර ගැනීම, රූපවාහිනී වැඩසටහන් ඵලදායී ලෙස යොදා ගැනීම යන මාතෘකා තේමා කොට ගනිමින් මාර්ගෝපදේශ රචනා සඳහා විස්තරාත්මක ව්‍යුහගත ඡේද 4ක් ඉදිරිපත් කොට තිබුණි. එක් එක් රචනා මාතෘකා යටතේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමේ අවශ්‍යතාව තේමා කර ගත් රචනයේ පහසුතාව 55%ක් ද විධිමත් කසළ කළමණාකරණය තේමා කර ගත් රචනයේ පහසුතාව 27%ක් ද අලි සම්පත ආරක්‍ෂා කර ගැනීම තේමා කර ගත් රචනයේ පහසුතාව 15%ක් ද රූපවාහිනී වැඩසටහන් ඵලදායී ලෙස යොදා ගැනීම තේමා කර ගත් රචනයේ පහසුතාව 21%ක් ද විය.

සමස්තයක් ලෙස ගත් කළ රචනා ප්‍රශ්නයේ මධ්‍යක පහසුතාව 30%ක් වන බැවින් රචනා ලිවීමේ නිපුණතාව අපේක්‍ෂකයන් තුළ තව දුරටත් වර්ධනය කළ යුතු බව පැහැදිලි ය. ස්වකීය අදහස් නිදහස් ව හා නිර්මාණාත්මක ව ජනනය කර වීමටත් ඒවා විධිමත් ව, සංවිධානාත්මක ව, නිරවුල් ව හා ව්‍යාකරණානුකූල ව ඉදිරිපත් කිරීමටත් අපේක්‍ෂකයන් යොමු කළ යුතු ය.

රචනා මාතෘකාව හඳුනා ගැනීමට උපයෝගී කර ගැනීම සඳහා දී ඇති ඡේදයේ කරුණු ඉදිරිපත් කර ඇති රටාව සැලකිල්ලට ගැනීමෙන් රචනා සැකිල්ල යටතේ අපේක්‍ෂකයන්ට කරුණු සංවිධානය කර ගැනීමට පහසු වේ. වචන 250කට නො අඩු යන සීමාව 250 - 300 අතර ලිවීමේ හැකියාවට අවකාශයක් ලැබේ. අතිරේක වශයෙන් සම්භාව්‍ය ගද්‍ය - පද්‍ය පොත පත කියවීම ද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පරිශීලනය කිරීම ද විශේෂයෙන් ම අන්තර්ජාලය ඇසුරෙන් නව ලෝකය පිළිබඳ ව රැස් කර ගත හැකි කරුණු ද සාර්ථක රචනා නිර්මාණය කිරීම සඳහා මහඟු අත්වැලක් කර ගත හැකි ය.

දී ඇති රචනා ව්‍යුහ අතුරෙන් අපේක්‍ෂකයන්ට මග පෙන්වීමක් වශයෙන් (iii) මාතෘකාව යටතේ රචනා ආදර්ශයක් මෙහි දක්වා ඇත.

**2 (III) අලි සම්පත රැක ගනිමු**

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන අලියා අප්‍රිකානු අලියාට වඩා දැකුම්කලු ය. දළ සහිත ඇත්තු වටිනාකමින් මෙන් ම දර්ශනීයත්වයෙන් ද අනූන වෙති. හීලෑ කර ගත් ඇතුන් බර වැඩට යොදා ගැනීම, පෙරහැරවල් සඳහා යොදා ගැනීම, විදේශීය සංචාරකයන් ආකර්ශනය කරවා ගැනීම ආදිය මගින් අලි සම්පතට ආර්ථික වටිනාකමක් ද මුසු වී තිබේ.

එසේ වුව ද වර්තමානයේ අලි සම්පත විනාශ වීමේ තර්ජනයකට මුහුණ පා සිටී. ප්‍රධාන වශයෙන් පාරිසරික අධ්‍යයනයකින් තොරව කරනු ලබන සංවර්ධන කටයුතු නිසා ඔවුන්ට ප්‍රධාන තර්ජනය එල්ල වී ඇත්තේ මිනිසාගෙනි. දශක කිහිපයක සිට ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාන සංවර්ධන යෝජනා ක්‍රම සැලසුම් කර තිබුණේ මෙම සතුන් පිළිබඳ අල්ප මාත්‍ර වූ ද සැලකිල්ලක් දක්වා නොවේ. ඒ සඳහා කැලෑ එළි කර ජනපදිකයන් ලෙස ගොවීන්ට ගොවිතැන් හා නිවාස ඉදි කිරීම සඳහා ඉඩම් බෙදා දීම මගින් අලි ඇතුන්ගේ නිජබිම් හා ගොදුරුබිම් ඔවුන්ට අහිමි විය. අලි ඇතුන් මිනිසුන්ගේ මෙම ආක්‍රමණශීලී ක්‍රියාවලට එරෙහි ව සිය ගොදුරු බිම් කරා නැවත පැමිණුනේ ගොවීන්ගේ බව බෝග විනාශ කරමිනි. එහි ප්‍රතිඵලය වූයේ අලි මිනිස් ගැටුමක් නිර්මාණය වීමයි. මිනිසුන්ගේ උපක්‍රමශීලී ප්‍රහාරයන්ට ලක්වන මෙම අසරණ සත්තු දිනෙන් දින විනාශයට පත් වෙති.

ඒ අතර ම අලිමංකඩ හරහා මහා මාර්ග හා දුම්රිය මාර්ග ඉදි කිරීම නිසා රාත්‍රී කාලයේ සංචරණය කරන අලි ඇත්තු වාහන අනතුරුවලට මුහුණ දී මරණයට පත් වෙති. ඇතැම් සත්තු අබල දුබලතා නිසා පීඩාවට පත් වෙති.

අලි ඇතුන් වෙසෙන කැලෑබද ප්‍රදේශවලට කුණු කසළ බැහැර කිරීම ද තවත් ඔවුන් මුහුණ පාන ව්‍යවසනයකි. ඒවායේ ඇති පොලිතීන් ආහාරයට ගැනීම නිසා අකාලයේ ජීවිතවලින් වන්දි ගෙවන අසරණ අලි ඇත්තු බොහෝ ය. ඒ හැර ඇතුන්ගේ වටිනා දළ පැහැර ගැනීම සඳහා ඇතැම් කූට ජාවාරම්කරුවෝ ඇතුන් උපක්‍රමශීලීව මරා දමති. මේ සඳහා 'හක්ක පටස්' තැබීම, වෙඩි තැබීම ආදී උපක්‍රම ඔවුහු භාවිත කරති.

කෙසේ වුව ද මෙරට අලි සම්පත විනාශ වීමේ ප්‍රධාන තර්ජනය එල්ල වී ඇත්තේ මිනිසා වෙතින්ම ය. බුද්ධිමත් සතෙකු වූ අලියා මිනිසාට එරෙහි ව නැගී සිටීම මිනිසාගේ ම අදූරදර්ශී ක්‍රියාවල ප්‍රතිඵලයකි.

වන සතුන්ගේ ආරක්ෂාව උදෙසා පිහිටුවන ලද රාජ්‍ය ආයතන බොහෝ ය. පරිසර හිතකාමී සංවිධාන බොහෝ ය. පරිසරයට ආදරය කරන පරිසර හිතකාමීහු බොහෝ ය. ඒ සියලු දෙනාගේ වගකීම විය යුත්තේ මෙම වටිනා සතුන් ලක් බිමෙන් තුරන් වී යාමට නොදී ආරක්ෂා කර ගැනීමයි. ඒ සඳහා රජය ප්‍රමුඛත්වය ගත යුතුය. අණපනත් යාවත්කාලීන කළ යුතු ය. දීර්ඝ කාලීන සැලසුම් ක්‍රියාත්මක කොට අලි ඇතුන් සංරක්ෂණය කිරීමට කටයුතු කිරීම ඔවුන්ගේ පමණක් නොව සියලු වන සතුන්ගේ සුරක්ෂිතභාවය සඳහා හේතු වනු ඇත.

3 ප්‍රශ්නය

අපේක්ෂණය : **කිසියම් කොටසක් කියවා එහි සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීම.**

ව්‍යූහය : **දී ඇති පාඨය තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවීම.**

3. පහත දැක්වෙන පාඨය වචන **50 - 60** අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

*(ලකුණු 10 යි)*

මහ පොළොවෙහි ගල් කැට එමට ඇත. එහෙත් මැණික් කැට ඇත්තේ ඉතා ස්වල්පයකි. එමෙන් ලෝකයෙහි මිනිස්සු එමට ඇත. එහෙත් ආත්ම ශක්තිය ඇති මිනිසුන් ඇත්තේ ස්වල්පයකි. අනගාරික ධර්මපාලතුමා ද ඒ ඉතා ස්වල්ප දෙනාගෙන් එක් කෙනෙකි. පරාධීනත්වය නමැති කුඩැල්ලා විසින් සිංහල ජාතිය නමැති මිනිස් සිරුරෙහි ලේ බී, සුදුමැලි ව, ඇට සැකිලි ව, අඩපණ ව තිබුණු සමයෙහි ජාත්‍යාලය නමැති ලේ අභ්‍යන්තරයට විද ජාතික සිරිත් විරිත් හා සිතුම් පැතුම් නමැති පෝෂ්‍යාහාර කවා ආගම භක්තිය නමැති බෙහෙත් පොවා ශක්තිමත්භාවයට හා පුෂ්ටිමත්භාවයට පමුණුවාලීමේ කාර්යය ආරම්භ කිරීමට තරම් ප්‍රබල ආත්ම ශක්තියක් ඇති පුරුෂයෙක් ලංකාවට අවශ්‍ය විය. ලෝකයේ නොයෙක් රටවල ඇවිද්ද, නොදියුණු ජාතීන් දියුණු වූ හැටි දැක්ක, දියුණු ජාතීන් වැඩ කරන සැටි දුටු, පරාධීන ජාතීන් ස්වාධීනත්වය තකා වැඩ කරන සැටි දුටු, පරාධීන ජාතීන් ස්වාධීනත්වය තකා වැඩ කරන සැටි නැරඹූ ධර්මපාලතුමා ස්වකීය ජාතිය නමැති ලෙඩා ගළවා ගැනීම සඳහා ඉදිරිපත් විය. "මගේ බිරිඳ ය, මගේ පුතා ය, මගේ දුව ය, මගේ පවුල ය" යනා දී වශයෙන් පෞද්ගලිකත්වය බලපෑමට කසාද බැඳීම තරම් හේතු වන අන් කිසිවක් නැති බව ඔහුට වැටහිණි. රටකට, ජාතියකට හා ආගමකට පොදුවේ වැඩ කිරීමට මුළු කාලය යොදා වැඩ කිරීමට, නිදහසේ වැඩ කිරීමට අනගාරිකත්වය තරම් සුදුසු තත්ත්වයක් නැති බව ඔහුට පෙනී ගියේ ය. එබැවින් ම ඔහු අනගාරික විය.

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**සාරාංශය සඳහා අන්තර්ගත විය යුතු කරුණු**

- අනගාරික ධර්මපාලතුමා ලෝකයේ ආත්ම ශක්තිය ඇති දුර්ලභ මිනිසුන්ගෙන් කෙනෙකු බව
- පරාධීනත්වයෙන් ජාතිය අඩපණ වූ යුගයක ජාතික සිරිත් විරිත්, සිතුම් පැතුම්, ආගම් භක්ති වර්ධනය කොට ජාතිය නගා සිටුවීමට ඉදිරිපත් වූ බව
- ඒ සඳහා රට රටවල ඇවිද ලද අත්දැකීම් එතුමාට උපකාරී වූ බව
- විවාහයෙන් පෞද්ගලිකත්වය ඉස්මතු වන බැවින් නිදහසේ පොදු කටයුතුවල යෙදීමට අනගාරික වූ බව

**ලකුණු ප්‍රදානය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු**


ලකුණු ප්‍රදානය තේමා තුනක් යටතේ සිදු විය යුතු ය.

| | |
|---|---|
| අන්තර්ගතය | 06 |
| භාෂා භාවිතය | 02 |
| ශෛලිය | 02 |

තනි ඡේදයක් ලෙස ලියා නැත්නම් ශෛලියට ඇතුළත් ලකුණු දෙක (02) අඩු කරන්න.

**(ලකුණු 10යි.)**


**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයනගෙන් 86%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 8%ක් ද
3 - 5 ප්‍රාන්තරයේ 26%ක් ද
6 - 7 ප්‍රාන්තරයේ 48%ක් ද
8 - 10 ප්‍රාන්තරයේ 18%ක් ද

ලෙසින් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10න් හරි අඩකට වැඩියෙන් එනම් ලකුණු 6ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හිමි කර ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 66%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 34%ක් පමණි.




අනිවාර්ය ප්‍රශ්නයක් වූ සාරාංශකරණය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂක සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතින අතර ඔවුන්ගෙන් 66%ක බහුතරයක් ප්‍රදානය කෙරෙන ලකුණුවලින් අඩකට වැඩියෙන් ලබා ගැනීමට සමත් වී ඇත. ඒ අනුව ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 59%ක් තෙක් වර්ධනය වී ඇත.

අපේක්ෂකයන්ට සාරාංශකරණය පිළිබඳ මනා පුහුණුවක් තිබිය යුතු ය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. අපේක්ෂිත සාරාංශකරණය සඳහා ආදර්ශයක් පහත දැක් වේ.

**ආදර්ශ සාරාංශය**

අනගාරික ධර්මපාලතුමා ලෝකයේ ආත්ම ශක්තිය ඇති දුර්ලභ මිනිසුන්ගෙන් කෙනෙකි. පරාධීනත්වයෙන් අඩපන වූ යුගයක ජාත්‍යාලය, ජාතික සිරිත් විරිත් හා චින්තනය ආගමික භක්තිය වගා කොට ජාතිය නගා සිටුවීමට ඉදිරිපත් වූ එතුමා රටරටවල්වල ඇවිද ලද ඇත්දැකීම් ඉවහල් කර ගෙන විවාහයෙන් පෞද්ගලිකත්වය ඉස්මතු වන බව දැන සිය මුළු කාලය නිදහසේ පොදු කටයුතුවල යෙදවීම පිණිස අනගාරික විය.

වචන 53කි

4 ප්‍රශ්නය

අපේක්ෂණය : අපේක්ෂකයාගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කිරීම

ව්‍යූහය : ඡේදයක් ඇසුරෙන් සැකසෙන ප්‍රශ්න පහකින් සමන්විත ය.

4. පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. (ලකුණු 10 යි)

සාහිත්‍යය යන්න මුලදී පෙරදිග විචාරයෙහි යෙදී ඇත්තේ ශබ්ද හා අර්ථ දෙක සහිත නිර්මාණ උදෙසා ය. මේ නිර්මාණ ගද්‍ය, පද්‍ය හා මිශ්‍ර හෙවත් නාට්‍ය වශයෙන් තෙයාකාර වේ. මේ අනුව ශබ්ද හා අර්ථ දෙකින් සරසන ලද රසවත් නිර්මාණ සාහිත්‍යය ලෙස හැඳින්විය හැකි ය.

සාහිත්‍යකරණය නිර්මාණාත්මක කාර්යයකි. නිර්මාණාත්මක ලේඛන මඟින් කෙරෙන්නේ රසභාව දැනවීම යි. එසේ නිර්මාණකරණයේ නියැළීමටත්, විචාරාත්මක ලෙස රස වින්දනයේ යෙදීමටත් කෙනෙකු තුළ පැවතිය යුතු මූලික ගුණාංග ගැන අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ. සාහිත්‍ය නිර්මාණයක් බිහි වන්නේ සාහිත්‍යකරුවා තුළ පවත්නා ප්‍රතිභා ශක්තිය නිසා ය. අපූර්ව වූ යමක් නිර්මාණය කිරීමේ හැකියාව ප්‍රතිභාව යි. එසේ ම බොහෝ පොත පත කියවීමෙන් හා අත්දැකීම් මඟින් ලබා ගත යුතු බහුශ්‍රැතභාවය සාහිත්‍යකරුවෙකුට අවශ්‍ය වේ. උචිත අනුචිත දේ තෝරා බේරා ගැනීමේ හැකියාව ද සාහිත්‍යකරුවා තුළ තිබිය යුතු ය. මෙය හැඳින්වෙන්නේ ව්‍යුත්පත්තිය යනුවෙනි. එසේම සාහිත්‍යකරුවා නිරතුරුව ම නිර්මාණ කාර්යයෙහි යෙදිය යුතු ය. සිය කාර්යය කෙරෙහි නිරන්තරයෙන් ලබන මේ අභ්‍යාසය සතතාභ්‍යාසය යි.


(i) ලේඛකයා මෙහි සඳහන් කරන පරිදි සාහිත්‍යය යනු කුමක් ද?
(ii) මෙහි දැක්වෙන සාහිත්‍ය නිර්මාණ වර්ග මොනවා ද?
(iii) සාහිත්‍ය නිර්මාණකරුවා තුළ පැවතිය යුතු මූලික ගුණාංග හතර දක්වන්න.
(iv) නිර්මාණකරුවා හැරුණු විට එම ගුණාංග සතු කර ගත යුතු අනෙක් පුද්ගලයා කවුද?
(v) 'ප්‍රතිභාව' යන්න වෙනත් වචනවලින් පැහැදිලි කරන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) ශබ්ද හා අර්ථ දෙක සහිත නිර්මාණයි
(ii) ගද්‍ය, පද්‍ය හා මිශ්‍ර හෙවත් නාට්‍ය
(iii) ප්‍රතිභාව, බහුශ්‍රැතභාවය, ව්‍යුත්පත්තිය, සතතාභ්‍යාසය
(iv) සහෘදයා / රස විඳින්නා / රසිකයා / විචාරකයා
(v) අපූර්ව වූ යමක් නිර්මාණය කිරීමේ හැකියාව

**(ලකුණු 02 x 05) - (ලකුණු 10යි.)**


**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 83% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 0 - 2 | ප්‍රාන්තරයේ | 10%ක් ද |
| | 3 - 5 | ප්‍රාන්තරයේ | 26%ක් ද |
| | 6 - 7 | ප්‍රාන්තරයේ | 24%ක් ද |
| | 8 - 10 | ප්‍රාන්තරයේ | 40%ක් ද |

ලෙසින් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 64%ක් වන අතර 36%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩු ප්‍රමාණයකි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 5 අතුරෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ (i) කොටස සඳහා ය. එහි පහසුතාව 88%කි. (ii),(iii),(iv),(v) කොටස්වල පහසුතාව පිළිවෙළින් 77%,67%,22% හා 52%කි. (ii),(iii) කොටස්වල පහසුතාව උසස් මට්ටමක පවතින අතර (v) කොටසේ පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතී. (iv) කොටසේ පහසුතාව ඉතා අඩු මට්ටමක පවතී. ඉදිරිපත් කර ඇති පාඨය අවබෝධයෙන් යුතුව කියවා අසා ඇති ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයා ගැනීමට අපේක්ෂකයන් සමත් විය යුතු නමුත් බහුතර පිරිසක් තුළ එම කුසලතා සංවර්ධනය වී නොමැති බව (iv),(v) අනුකොටස්වල පහසුතාව මගින් පිළිබිඹු වේ.

දෙන ලද පාඨයක් ඇසුරෙන් අපේක්ෂකයන්ගේ අවබෝධය මැනීම තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා බාහිර පොතපත, මුද්‍රිත සඟරා ආදිය පරිශීලනය සඳහා ඔවුන් යොමුකරලීම මෙන් ම පන්ති කාමරය තුළ දී අර්ථාවබෝධය පිළිබඳ අභ්‍යාසවලට හුරු කිරීම ද කළ යුතු ය.

දෙන ලද පාඨය කියවා අසන ලද ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරු තෝරා ගැනීමේ හැකියාව ඇතැම් අපේක්ෂකයන්ට නොතිබුණු බව පැහැදිලි වන බැවින් පිළිතුරු ඍජු ව තෝරා ගෙන නිශ්චිත ව ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් යොමු කළ යුතුව ඇත.

අවබෝධය පිළිබඳ විමසා තිබූ ප්‍රශ්න පහේ පහසුතාව 22% - 88% අතර තිබිණි. ඒ අනුව මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 61%කි. මෙම තත්ත්වය සංවර්ධනය කිරීම සඳහා බාහිර පොත්පත් පරිශීලනයට ශිෂ්‍යයන් උනන්දු කරවීම ගුරුභවතුන්ගේ කාර්යයකි. එහිලා දුරවබෝධ වචනවල අර්ථාවබෝධයට ද ශිෂ්‍යයන් යොමු කළ යුතු ය.

5 ප්‍රශ්නය

අපේක්ෂණය : ප්‍රායෝගික ලේඛන පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම
ව්‍යුහය : නිර්දිෂ්ට ප්‍රායෝගික ලේඛන දෙකක් ඇසුරෙන් ප්‍රශ්නය සැකසී ඇත.

5. රත්මල්ගම විද්‍යාලංකාර පිරිවෙනේ මහා ශිෂ්‍ය සංගමය මගින් පරිවෙණාධිපති හිමියන්ගේ අනුමැතිය ඇති ව දින දෙකක අධ්‍යාපන චාරිකාවක් යාමට කටයුතු සංවිධානය කර ඇත. පරිවෙණාධිපති හිමි ඇතුළු ගුරු මණ්ඩලය ද සහභාගි වන එම චාරිකාව සඳහා අන්තේවාසික ශිෂ්‍යයන්ගේ භාරකාර හිමිවරුන්ගේ ලිඛිත කැමැත්ත ලබා ගැනීමට පරිවෙණාධිපති හිමියන් මගින් යැවෙන ලිපියක් සකස් කරන්න. චාරිකාවේ අධ්‍යාපන වටිනාකම, නැරඹීමට අපේක්ෂිත ස්ථාන, නවාතැන් ගන්නා ස්ථානය හා කාලසටහන ඇතුළත් කෙටි සඳහන් කිරීමක් ද ඇතුළත් කරන්න. (ඔබ සංගමයේ ලේකම් ලෙස සිතන්න. වචන **100** ක් පමණ සෑහේ.)

*(ලකුණු 15 යි)*

නැතහොත්

කෑගල්ල, අරණායක ප්‍රදේශයේ සුළු අපනයන භෝග වගා කටයුතුවල නියුක්ත වූවන් ඒකරාශී කර ගොවි සමාජයක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. එම සමාජයේ කැඳවුම්කරු වන තිස්ස මංගලගම ඔබ යැයි සිතා ගොවි පිරිස ඒකරාශී කිරීමට යෝග්‍ය දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න. සංගමයේ අරමුණු, එමගින් සුළු අපනයන භෝග වගා කරුවන්ට සැලසෙන සෙත, පැවැත්වෙන ස්ථානය, දිනය, වේලාව හා වැඩසටහන පිළිබඳ කෙටි සඳහන් කිරීමක් ද ඇතුළත් කරන්න. (වචන **100** ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.)

*(ලකුණු 15 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

**රාජකාරී ලිපිය**

- **ආකෘතිය - (ලකුණු 04යි.)**
  - යවන්නාගේ ලිපිනය හා දිනය **(ලකුණු 01යි.)**
  - ආමන්ත්‍රණය **(ලකුණු 01යි.)**
  - මාතෘකාව **(ලකුණු 01යි.)**
  - අවසානය පරිවෙණාධිපති හිමියන්ගේ හා ලේකම්ගේ අත්සන, තනතුර නම **(ලකුණු 01යි.)**
- **අන්තර්ගතය - (ලකුණු 08යි.)**
  - චාරිකාවෙහි යෙදෙන දින හා නවාතැන් ගන්නා ස්ථානය **(ලකුණු 02යි.)**
  - අධ්‍යාපන වටිනාකම **(ලකුණු 02යි.)**
  - නැරඹීමට අපේක්ෂිත ස්ථාන **(ලකුණු 02යි.)**
  - දළ කාලසටහන හා කැමැත්ත ප්‍රකාශ කරන ලෙස ඉල්ලීම **(ලකුණු 02යි.)**

- **ශිල්පීය දක්ෂතා - (ලකුණු 03යි.)**
  - අක්ෂර වින්‍යාසය හා අත් අකුරු **(ලකුණු 01යි.)**
  - උක්තාඛ්‍යාත පද සම්බන්ධය **(ලකුණු 01යි.)**
  - පද බෙදා ලිවීම හා විරාම ලක්ෂණ **(ලකුණු 01යි.)**

නැතහොත්

**දැන්වීම් පත්‍රිකාව**

- **ආකෘතිය - (ලකුණු 04යි.)**
  - මාතෘකාව **(ලකුණු 01යි.)**
  - පළ කරන්නාගේ තනතුරු නාමය **(ලකුණු 01යි.)**
  - ආයතනයේ නම හා ලිපිනය **(ලකුණු 01යි.)**
  - පැවැත්වෙන දිනය හා වේලාව **(ලකුණු 01යි.)**


- **අන්තර්ගතය - (ලකුණු 08යි.)**
  - සුළු අපනයන බෝගවල ආර්ථික වටිනාකම **(ලකුණු 02යි.)**
  - ගොවීන් ඒකරාශී වීමේ වැදගත්කම **(ලකුණු 02යි.)**
  - ගොවීන්ට සැලසෙන ආර්ථික වාසි **(ලකුණු 02යි.)**
  - වැඩසටහන පිළිබඳ විස්තර **(ලකුණු 02යි.)**

- ශිල්පීය දක්ෂතා - (ලකුණු 03යි.)
  - අක්ෂර වින්‍යාසය හා අත් අකුරු (ලකුණු 01යි.)
  - උක්තාඛ්‍යාත පද සම්බන්ධය (ලකුණු 01යි.)
  - පද බෙදා ලිවීම හා විරාම ලක්ෂණ (ලකුණු 01යි.)

(ලකුණු 15යි.)

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**


**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 71%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 9%ක් ද
4 - 7 ප්‍රාන්තරයේ 21%ක් ද
8 - 11 ප්‍රාන්තරයේ 46%ක් ද
12 - 15 ප්‍රාන්තරයේ 24%ක් ද

ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්නයකි. එක් ප්‍රශ්නයක් තෝරා ගෙන පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට අවස්ථාව ලබා දී ඇත.




5 ප්‍රශ්නයේ වෛකල්පික ප්‍රශ්න දෙක සඳහා ම පහසුතාව 60%කි. ඒ අනුව පහසුතා මධ්‍යස්ථ මට්ටමක පවතී. ප්‍රායෝගික ලේඛන යටතේ පළමු ප්‍රශ්නය වන රාජකාරි ලිපියේ ආකෘතියට ලකුණු 4ක් ද අන්තර්ගතයට ලකුණු 8ක් ද ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 3ක් ද වෙන් කර ඇත.
විකල්ප ප්‍රශ්නය වන දැන්වීම් පත්‍රිකාවේ ආකෘතියට ලකුණු 4ක් ද අන්තර්ගතයට ලකුණු 8ක් ද ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 3ක් ද වෙන් කර ඇත.
මෙහිදී අන්තර්ගතයට අයත් ප්‍රධාන කරුණු හඳුනා ගැනීමට ශිෂ්‍යයන් හුරු කළ යුතු ය. එසේ වූ කල්හි අන්තර්ගතයට වෙන් කර ඇති මුළු ලකුණු අපේක්ෂකයන්ට හිමි කර ගැනීමට පහසු වේ. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම සතුටුදායක ය. නියමිත ප්‍රායෝගික ලේඛන ආකෘතියට අනුව ලිවීම හුරු කළ යුතු ය. මෙබඳු ප්‍රශ්නවල පහසුතා මට්ටම ඉහළ නංවා ගැනීම සඳහා විවිධ ප්‍රායෝගික ලේඛනවලට අදාළ ආකෘති පිළිබඳව අපේක්ෂකයන් දැනුවත් කොට සුදුසු අභ්‍යාසවල යෙදවීම යෝග්‍ය ය.

## 2.3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.3 1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

II පත්‍රය - **කාලය : පැය 02 යි.**

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **හතකින්** සමන්විත ය.


**1, 2, 3, 4** ප්‍රශ්න අනිවාර්ය වේ. **5, 6, 7** ප්‍රශ්නවලින් **එකක්** තෝරා ගත යුතු ය.

| | | |
|---|---|---|
| 1 ප්‍රශ්නය | : | කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි. |
| 2 ප්‍රශ්නය | : | නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගත් ගද්‍ය/පද්‍ය කොටස් ඇසුරෙන් මේ ප්‍රශ්නය සකස් කෙරෙන අතර අනුකොටස් දෙකකින් යුත් කොටස් 5කින් සමන්විත වේ. එක් අනුකොටසකට ලකුණු 02 බැගින් ලකුණු 20කි. |
| 3 ප්‍රශ්නය | : | වෛකල්පික ප්‍රශ්න දෙකකින් එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. ලකුණු 15කි. |
| 4 ප්‍රශ්නය | : | වෛකල්පික ප්‍රශ්න දෙකකින් එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. ලකුණු 15කි. |
| 5, 6, 7 ප්‍රශ්න | : | වෛකල්පික ප්‍රශ්න තුනකින් ප්‍රශ්න එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. ලකුණු 10කි. |

II පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 20 + 15 + 15 + 10 = 80

| | | | | |
|---|---|---|---|---|
| අවසාන ලකුණ ගණනය කිරීම | : | I පත්‍රය | = | 120 |
| | | II පත්‍රය | = | 80 |
| | | අවසාන ලකුණ | = | 200 ÷ 2 = 100 |

### 2.3.2 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමනඃ




**ප්‍රස්තාරය 8 (RD/16/4/MPF** පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

II ප්‍රශ්න පත්‍රයේ 1,2,3,4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

**පළමුවන ප්‍රශ්නය** මගින් නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් කෙටි පිළිතුරු සැපයිය හැකි අනු ප්‍රශ්න 10ක් ඉදිරිපත් කර ඇත. එම අනු ප්‍රශ්නවලින් 9ක් (අ), (ආ) ලෙස ප්‍රශ්න කොටස් දෙකකට බෙදා ඇත. (V) අනු ප්‍රශ්නය සඳහා ද අපේක්ෂිත පිළිතුරු දෙකකි. ඒ අනුව කොටස් 20 සඳහා ලකුණු 20ක් හිමි වේ. 2වන ප්‍රශ්නයට 95%ක් පිළිතුරු සපයා තිබුණ ද (ප්‍රස්තාරය 5) එහි සමස්ත පහසුතාව 24%කි.

**දෙවන ප්‍රශ්නය** සැකසී ඇත්තේ නිර්දිෂ්ට ග්‍රන්ථවල ගද්‍ය-පද්‍ය පාඨ ඇසුරෙනි. මෙහිදී නිර්දිෂ්ට පාඨ පහක් ඇසුරෙන් ප්‍රශ්න සැකසෙන අතර එක් කොටසකට ලකුණු 4 බැගින් ලකුණු 20ක් හිමි වේ. මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 91%ක් වන නමුත් එහි සමස්ත පහසුතාව 31%කි.

3,4 ප්‍රශ්නවලින් නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ විශ්ලේෂණාත්මක දැනුම ඇගයීමට ලක් කෙරෙයි. මෙහිදී විකල්ප ප්‍රශ්න තෝරා ගැනමේ අවස්ථාව ද අපේක්ෂකයන්ට හිමි වේ. මෙම ප්‍රශ්න දෙකට ලකුණු 15 බැගින් හිමි වේ.

**තුන්වන ප්‍රශ්නය** විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත වන අතර 'මගුල් ගීය' කවි පෙළ ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයේ පහසුතාව 45%කි. 'බැද්දේගම' නව කතාව ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයේ පහසුතාව 47%කි. මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 46%කි.

**හතරවන ප්‍රශ්නය** ද විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විතය. සැළලිහිණි සංදේශය ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයේ පහසුතාව 55%කි. සද්ධර්මාලංකාරය නිර්දිෂ්ට කොටස් ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයේ පහසුතාව 46%කි. මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 50%කි.

5,6,7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරා ගෙන පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට අවස්ථාව ලැබේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත. මෙහි දී 44%ක් ලෙස වැඩිම පහසුතාවය ලබා ගෙන ඇත්තේ හත්වන ප්‍රශ්නයට ය. අඩු ම පහසුතාව 30%ක් වූ අතර එය ප්‍රශ්න අංක 6 සඳහා ලබා ගෙන තිබුණි.

## 1 ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යූහය : කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

1. (i) සිට (x) තෙක් සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) (අ) චිරන්තන බණ කතා කලාවේ ආරම්භය ලෙස සැලකෙන කෘතිය කුමක් ද?

(ආ) එම කෘතිය අයත්වන යුගය සඳහන් කරන්න.

(ii) 'සියබස්ලකර' කෘතියේ සඳහන් පරිදි ගද්‍ය-පද්‍ය නිර්මාණයේ දී වස්තු විෂය කර ගන්නා ලෙස නිර්දේශිත කරුණු මොනවා ද?

(අ) පද්‍ය නිර්මාණයේ දී

(ආ) ගද්‍ය නිර්මාණයේ දී

(iii) (අ) 'සද්ධර්මාලංකාරය' කෘතිය කුමන ග්‍රන්ථයක සිංහල අනුවාදයක් ලෙස සැලකේ ද?

(ආ) සද්ධර්මාලංකාරය හැරුණු විට කතුවරයා රචිත වෙනත් කෘති දෙකක් සඳහන් කරන්න.

(iv) (අ) ඉදිරිපත් කරන දෙය සාවද්‍ය ආකාරයෙන් අර්ථකථනය වීම මගහරවා ගැනීමට සද්ධර්මරත්නාවලි කතුවරයා ගෙන ඇති ක්‍රියා මාර්ගය කුමක් ද?

(ආ) සද්ධර්මරත්නාවලි කෘතිය රචනා කිරීමේ දී කතුවරයාගේ අරමුණ වූයේ කුමක් ද?

(v) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

අග පිපි මල් මලිගිය ලිය කැලේයා
වග බැඳ හෙන රජ හස පුල් විලේයා

(vi) (අ) 'ලෙව්වමීගේ සිතුවිල්ලක්' පද්‍ය පන්තියෙහි රචකයා කවරෙක් ද?

(ආ) කොළඹ කවියේ ප්‍රථම යුගය නියෝජනය කළ කවියෙකු නම් කරන්න.

(vii) (අ) සංදේශ කාව්‍යයක දක්නට ඇති පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ආ) සැළලිහිණි සංදේශය රචනා වූයේ කුමන රජතුමාගේ කාලයේ දී ද?

(viii) 'දවස් ගානක් තිස්සේ මං මෙහාට ආවෙ මේක දැන ගන්ඩ'

(අ) මෙහි සඳහන් අයට දැන ගන්නට අවශ්‍ය වූයේ කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට කියන ලද්දක් ද?

(ix) මේ දරුවෝ හැම වේලේ මට පීඩා කෙරෙති. කිමෙක් ද? දෙමවුපියෝ අප දැක ඇඟ මස් කපා කද්ද?

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?

(ආ) දරුවන්ගේ මෙම හැසිරීමට හේතුව කුමක් ද?

(x) (අ) 'දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්' පැදි පෙළෙහි රචකයා නම් කරන්න.

(ආ) සිරි ගුණසිංහ කවියා අයත් වන්නේ කොළඹ යුගයේ කුමන කාණ්ඩයට ද?

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

1. (i) (අ) අමාවතුර
(ආ) පොළොන්නරු යුගය

(ii) (අ) බුද්ධ චරිතය / බුදු සිරිත
(ආ) ව්‍රත චාරිත්‍ර / වත් සිරිත්

(iii) (අ) පාලි රසවාහිනිය
(ආ) ගඩලාදෙණි සන්නය, නිකාය සංග්‍රහය, ජිනබෝධාවලිය මෙම ග්‍රන්ථවලින් දෙකක් ලියා තිබීම අවශ්‍යය ය. ගඩලාදෙණි සන්නය වෙනුවට බාලාවතාර සන්නය ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න.

(iv) (අ) නිදසුන් මගින් පැහැදිලි කර දීම.
(ආ) පෙළ බස පිළිබඳ අවබෝධය අඩු වුව ද කුසල් කරනු කැමති ශ්‍රද්ධාවන්තයන් යහමග යැවීම.

(v) ළග තුරුමල් ගිලිහුණු රොනවුලේයා
මඟ බැස යව පළ හෙළ වැලි තෙලේයා

(vi) (අ) මොනිකා රුවන්පතිරණ
(ආ) පියදාස සිරිසේන / ආනන්ද රාජකරුණා / ඇස් මහින්ද හිමි / ජී.එච්. පෙරේරා

(vii) (අ)
- කථා නායකයා හෝ නායිකාව ප්‍රසිද්ධ පුද්ගලයෙකු වීම
- ආශිර්වාදය
- දූතයා වර්ණනා කිරීම
- යා යුතු ස්ථාන දැක්වීම
- මාර්ග වර්ණනය
- සංදේශය ඉදිරිපත් කිරීම

මෙම කරුණුවලින් දෙකක් සඳහන් කර තිබිය යුතු ය.
එක් පිළිතුරුක් පමණක් ලියා ඇත්නම් ලකුණු නැත.

(ආ) සවන පැරකුම්බා රජු / VI වන පැරකුම්බා රජු


(viii)
(අ) තම ස්වාමියාට කුමක් සිදුවුයේ ද යන්නයි
(ආ) පුංචි මැණිකා විසින් හිරපල්ලාට

(ix)
(අ) මහධන සිටාණන්ගේ දුව / සිටු දුව
(ආ) ඔවුන් තම මුතුන් මිත්තන් සමීපයට කැටුව යන ලෙස ඇවිටිලි කිරීම

(x)
(අ) පරාක්‍රම කොඩිතුවක්කු
(ආ) නිදහස් කවියේ ප්‍රථම යුගය

## 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





1 ප්‍රශ්නය තෝරා ගෙන ඇති පිරිස 95% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 0 - 5 | ප්‍රාන්තරයේ | 63%ක් ද |
| | 6 - 10 | ප්‍රාන්තරයේ | 30%ක් ද |
| | 11 - 15 | ප්‍රාන්තරයේ | 4%ක් ද |
| | 16 - 20 | ප්‍රාන්තරයේ | 3%ක් ද |

ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ 10ට අඩුවෙන් ලබා ගත් පිරිස 93%කි. ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 7%කි.

1 ප්‍රශ්නයෙහි කොටස් සහ අනුකොටස්වල පහසුතාව




1 ප්‍රශ්නයෙහි කොටස් සහ අනුකොටස්

මෙම ප්‍රශ්නය කොටස් 10කින් ද අනුකොටස් 19කින් ද සමන්විත ය. ඒ අතුරෙන් වැඩි ම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ (vi) කොටසයි. එහි (අ),(ආ) අනුකොටස් දෙකෙහි පහසුතාව පිළිවෙළින් 45%ක් සහ 61%කි. පහසුතාව අඩුම (ii) (ආ) අනුකොටස වන අතර, එහි පහසුතාව 7%ක් වේ. (i) (ආ) සහ (ii) (අ) අනුකොටස්වල පහසුතාව 9%ක් තරම් අඩු අගයකි. මෙම ප්‍රශ්නවලට අමතර ව පහසුතාව අඩු ම කොටස් වන්නේ (i),(අ) (iv)(අ), (v) සහ (ix)(අ),(ආ) අනුකොටස් ය. ඒ අනුව මෙම අනුකොටස්වල පහසුතාව පිළිවෙලින් 11%,13%,11%,14% සහ 14%කි. පොදුවේ ගත් කළ සෙසු අනුකොටස් සඳහා පහසුතාව 20% සිට 42% දක්වා විහිදී පැවතුණි.

මෙම ප්‍රශ්න විශ්ලේෂණය කළ විට පහත සඳහන් කරුණු ඉදිරිපත් කළ හැකි ය. ඒ අනුව (i) (අ),(ආ) චිරන්තන බණ කතා කලාවේ ආරම්භය ලෙස සැලකෙන අමාවතුර කෘතිය පාදක කරගෙන ද (ii) (අ),(ආ) අනුකොටස් 'සියබස්ලකර' කෘතිය අසුරෙන් ද (iv) (අ) අනුකොටස සද්ධර්මරත්නාවලිය කෘතිය ඇසුරෙන් ද (v) කොටස සැලළිහිණි සන්දේශය ඇසුරෙන් ද (ix) (අ),(ආ) අනුකොටස් චුල්ලසෙට්ඨි ජාතකය ඇසුරෙන් ද සැකසී තිබුණි.

මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී අඩු පහසුතා පෙන්නුම් කිරීමෙන් පැහැදිලි වන්නේ නිර්දිෂ්ට පුරාතන ගද්‍ය, පද්‍ය කෘති පරිශීලනය සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන දුර්වලතාවයි.

මෙම තත්ත්වය මඟ හරවා ශිෂ්‍යයන්ගේ ප්‍රශස්ත මට්ටම ඉහළ අගයකට ගෙන ඒමට නම් නිර්දිෂ්ට ග්‍රන්ථ අනුසාරයෙන් අනුමාන ප්‍රශ්න සකසා පිළිතුරු ලියවීම, වාචික කෙටි ප්‍රශ්න තරග පැවැත්වීම, අදාළ පද්‍ය කෘතිවලින් සුදුසු කවි තෝරා දී ඒවා වන පොත් කරවීමට සැලැස්වීම වැනි කරුණු කෙරෙහි ගුරුවරයා සැලකිලිමත් වුවහොත් ඉහළ සාධන මටට්මක් වෙත ශිෂ්‍යයා යොමු කිරීමට හැකි වනු ඇත.

**2 ප්‍රශ්නය**

අපේක්ෂණය : නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය ඇති ව පාඨය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම

ව්‍යුහය : නිර්දිෂ්ට ගද්‍ය/ පද්‍ය පාඨ ඇසුරෙන් ප්‍රශ්න සැකසී ඇත

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා, ඒ එකිනෙකට අදාළ ව (i) සිට (v) තෙක් දී ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 04 × 5 = 20 යි)*

(i) තෙපි තුලුන් කරා ගොසින් නිධාන පාවා ගනුව'යි රහල් කුමරුන් සරහා යවූ කල්හි කුමාරයෝත් දායාද ඉල්වමින් පසු පස්සෙහි ගමන් ගත්හ. බුදුහුත් නො නැවතු සේක. කැටිව යන්නෝත් බුදුන් හා කැටිව යන ගමන හෙයින් නවතන්නට යුක්ති නැති වන්නා නො නැවතුහ. රහල් කුමරහු ද සඳහා කැටිව නික්මුණු නකත් තරුවක් මෙන් නික්ම වෙහෙරට ගියහ.

(අ) මෙහි සඳහන් උපමාව සහ උපමේය වෙන්කොට ලියන්න.

(ආ) මෙම සිද්ධියෙන් අනතුරු ව වූ සිදුවීම කුමක් ද?

(ii) "පාස වසඟ වූ මා කිසි උපායෙකින් ගලවා ගන්ට නොනිසි වුව, එහෙයින් කිසි සැකයක් නො කොට තොපිත් නො රඳා පලා යව"

(අ) මෙම ප්‍රකාශය හා සැබැඳි අවස්ථාව කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අය දුන් පිළිතුර කුමක් ද?

(iii) වල දීන අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ තුබ නැඟෙන
වෙල ළස ගැවසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සඳැ උතුරින් පෙනෙන

(අ) රළ පෙළෙහි ස්වභාවය කවියා වර්ණනයට ලක් කරනුයේ කුමන ආකාරයට ද?

(ආ) කවියෙහි ඇතුළත් කාව්‍යෝක්තිය දක්වා එය හැඟවෙන කොටස උපුටා දක්වන්න.

(iv) "කිසිවක්හට මෙපවත් කීම් නම් මාගේ බණ ඇසීමට අන්තරාය වෙයි."

(අ) මෙහි සඳහන් වූ තැනැත්තා කිසිවකුටත් කීමට මැළි වූ කාරණය කුමක් ද?

(ආ) බණ ඇසීමෙන් අනතුරු ව මෙම තැනැත්තා ගත් ක්‍රියා මාර්ගය කෙටියෙන් ලියන්න.

(v)
සමන්පිච්ච මල් ඉහිරුණු
නිල් තණ කොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රෑට

(අ) මෙහි සඳහන් උපමාව හා උපමේය වෙන් කොට දක්වන්න.

(ආ) කවියා අහස ගැන මවන වාක් චිත්‍රය කෙටියෙන් පැහැදිලි කරන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) (අ) උපමාව - නකත් තරුවක්
උපමේය - රහල් කුමරුන්
(ආ) රහල් කුමරු මහණ කරවීම


(ii) (අ) මලෙහි බැඳුණු හංස රජු බේරා ගැනීමේ අරමුණින් පැමිණි සුමුඛ නම් හංස සෙනවියාට හංස රජු කළ ප්‍රකාශයකි.
(ආ) සුවපත් වූ නුඹ වහන්සේට සේවය කොට දුකට පැමිණි වේලෙහි හැර පියා නො යෙමි.

(iii) (අ) දැඩිව නැගෙන රළ පෙළ අහස වැළඳ ගැනීමට මෙන් සැරසෙන අයුරක් දිස්වෙන ලෙසිනි.
(ආ) අනුප්‍රාසය / ශබ්දධ්වනිය - නල බල සසල දළ රළ පෙළ
උපමාලංකාරය - වලඳින අදහසින් මෙන් සුරගඟ අඟන.

(iv) (අ) සර්පයෙකු විසින් තම පුතු දෂ්ට කරන ලද බව
(ආ) පුතු ඉස අල්වා ගෙන සත්‍ය ක්‍රියා කිරීමෙන් පුතු සුවපත් කර ගැනීම

(v) (අ) උපමාව - (සමන් පිච්ච මල් ඉහිරුණු) නිල් තණකොළ පිට්ටනියක්
උපමේය - රාත්‍රී ආකාශය
(ආ) රාත්‍රි ආකාශයේ තරු පායා ඇති අයුරු නිල් තණකොළ පිටියකට සමන් පිච්ච මල් වැටී ඇති භූමියක් මෙනි. මෙ මගින් රාත්‍රී ආකාශය චමත්කාර දසුනක් මවයි.


**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර දෙස බැලීමේ දී මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 91%ක් ගත්ත ද නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමේ දී අඩු ප්‍රතිශතයක් ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 49%ක් ද
6 - 10 ප්‍රාන්තරයේ 34%ක් ද
11 - 15 ප්‍රාන්තරයේ 11%ක් ද
16 - 20 ප්‍රාන්තරයේ 6%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ 10ට අඩුවෙන් ලබා ගත් පිරිස 83%කි. ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 17%කි.




මෙම ප්‍රශ්නය කොටස් 5කින්ද අනුකොටස් 10කින්ද සමන්විත වේ. ඒ අතුරෙන් වැඩිම පහසුතාවය (i) කොටසෙහි (ආ) අනුකොටස පෙන්නුම් කරන අතර එහි පහසුතාවය 61%කි. (I) කොටසෙහි (අ) අනුකොටසෙහි පහසුතාවය 36%කි. (v) කොටසෙහි (අ) අනුකොටසෙහි පහසුතාවය 42%ක් ද (ආ) අනුකොටසෙහි පහසුතාවය 42%ක් ද විය. අනෙකුත් කොටස් සහ අනුකොටස් සඳහා පහසුතාවය 16% සිට 25% දක්වා විහිදී පැවතුණි.

පුරාතන ගද්‍ය, පද්‍ය හා නූතන පද්‍ය සාහිත්‍යයට අයත් පාඩම්වල කතාසාරය, අවස්ථා හා සිද්ධි මතකයේ රැඳෙන ආකාරයට ඉගැන්වීම සඳහා විවිධ ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමට ගුරුභවතුන් යොමු විය යුතු අතර එයින් අපේක්ෂකයන්ගේ සාධන මට්ටම් වර්ධනය කර ගැනීමට යොමු කිරීම වැදගත් වේ. නිර්දිෂ්ට සාහිත්‍යය කොටස් ඇසුරෙන් නිරන්තර අභ්‍යාසවල යෙදවීම මගින් සාර්ථක පිළිතුරු අපේක්ෂා කළ හැකි ය.

**3 ප්‍රශ්නය**

අපේක්ෂණය : ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීම

ව්‍යූහය : විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විතය.

3. 'මඟුල් ගීය' කවි පෙළින්

(අ) අවුරුදු සමයේ අසිරියත්

(ආ) ස්වභාව ධර්මයේ සුන්දරත්වයත් නිරූපිත ය.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

බැද්දේගම නවකතාවෙහි

(අ) ආරච්චිලගේ චරිතය හා

(ආ) බබුන්ගේ චරිතය මගින්

එකිනෙකට පරස්පර විරෝධී චරිත ලක්ෂණ නිරූපණය කෙරෙයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

*(ලකුණු 15 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(අ) වෙන් වුවත් සිත කලඹන්නී
පැරණි තරහ හැම යට ලන්නී

ගෙයි ගෙයි බක් වෙස් ගන්වන්නී
අවුරුදු කිරිබත උයවන්නී

(ආ) මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී
ජම්බු ගහට රත පොරවන්නී
එරබදු පැහැයෙන් දුලවන්නී
ගමේම පුහුලන් ඉදවන්නී

වැනි උදාහරණ දක්වමින් විස්තර කර තිබිය යුතු ය. සුදුසු වෙනත් උදාහරණ ද පිළිගන්න.

**(ලකුණු 15යි.)**

නැතහොත්


(අ) ආරච්චිලගේ චරිතය
- අන් අයගේ ජීවිත කෙරෙහි දක්වන ආකල්ප
- ආත්මාර්ථකාමී ගති ලක්ෂණ
- බබුන් විනාශ කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග
- ප්‍රනාන්දු මුදලාලි සමග දක්වන ඇසුර

(ආ) බබුන්ගේ චරිතය
- සිළිඳුගේ දියණිය විවාහ කර ගැනීමට තීරණය කිරීම
- ඍජු ප්‍රතිපත්තිවල සිටීමට ගන්නා උත්සාහය
- අන් අය කෙරෙහි බලපෑම් කිරීමට නොපෙලඹීම
- අහිංසක ලෙස ජීවත් වීමට ගන්නා උත්සාහය

වැනි අවස්ථා උදාහරණ දක්වමින් පැහැදිලි කිරීම අවශ්‍යය

එක් කරුණකට උදාහරණවලට 02 බැගින් **ලකුණු 04යි.**
විස්තරයට **ලකුණු 11යි.**
**(ලකුණු 15යි.)**


**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




තුන්වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වූවකි. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් පිළිතුරු සපයා ඇත්තේ 72%ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 15කි.

ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 32%ක් ද
4 - 7 ප්‍රාන්තරයේ 29%ක් ද
8 - 11 ප්‍රාන්තරයේ 26%ක් ද
12 - 15 ප්‍රාන්තරයේ 13%ක් ද

වශයෙන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 4ක් හෝ 4ට අඩුවෙන් ලබා ගත් පිරිස 61%කි. ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 39%කි.




3 ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
එම ප්‍රශ්න දෙක අතුරෙන් පළමුවන ප්‍රශ්නයෙහි පහසුතාව 45%කි. විකල්ප අනෙක් ප්‍රශ්නයෙහි පහසුතාව 47%කි.
මෙහි පළමුවන විකල්ප ප්‍රශ්නයේ පහසුතාවට වඩා විකල්ප අනෙක් ප්‍රශ්නයේ පහසුතාව වැඩි වී ඇති බව පෙනේ. මඟුල් ගීය කවි පෙළ ඇසුරෙන් සකසා තිබූ පළමුවන ප්‍රශ්නයට වඩා බැද්දේගම නවකතාව ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයේ පහසුතාව වැඩි වී ඇත.
නූතන සාහිත්‍යය ඇසුරෙන් සැකසෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ගේ පරිචයක් ඇති කිරීමට සුදුසු ඉගැන්වීමේ ක්‍රම අනුගමනය කිරීමට ගුරුභවතුන් යොමු විය යුතු ය.
සමස්තයක් වශයෙන් ගත් කළ මෙකී ප්‍රශ්න පිළිබඳ පන්ති කාමරයේ දී සාකච්ඡා කිරීම හා ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම මගින් නිර්දිෂ්ට කෘති කෙරෙහි අපේක්ෂකයන්ගේ ප්‍රතිචාරය වර්ධනය කිරීමෙන් පිළිතුරු සැපයීමේ හැකියාව සතුටුදායක මට්ටමකට ළඟා කර ගත හැකි වේ.

**4 ප්‍රශ්නය**

අපේක්ෂණය : ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීම

ව්‍යූහය : විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විතය.

4. (අ) ස්වාභාවික පරිසර වර්ණනයත්

(ආ) සිද්ධි නිර්මාණයේ උචිත බවත්

සැළලිහිණි සංදේශය රසවත් කාව්‍ය නිර්මාණයක් බවට පත්වීමට හේතු වී ඇත.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

සත්‍යක්‍රියානුභාවයෙහි ආනිසංස ගෙන හැර දැක්වීමට

(අ) උපාසිකාවකගේ චරිතයත්

(ආ) මහතෙරකෙනෙකුන් වහන්සේගේ චරිතයත්

උපයෝගී කොට ගත් අයුරු සද්ධර්මාලංකාරයෙහි නියමිත කථා වස්තු දෙක ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 15 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

**(අ) ස්වාභාවික පරිසර වර්ණනා**

- වදිමින් සවස තල හැසිරෙන දිගතු වල
- පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
- උදුළ සොමි කැලුම් නිසයුරු හිමි පුවළ
- ලකළ ගුවන් තල සිරි යහන නිකසළ
- මඟ නිලමින් සිටි නා දොඹ නී පියල
- නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුල
- ගනේ මිණි බැබළි කිරණෙව් සතපාය
- අග පිපි මල් මලිගිය ලිය කැලේයා

**(ආ) සිද්ධි නිර්මාණයේ උචිත බව**

- අයිරාවණ වුවත් නවතන රිසින් එන
- කයිකාවලෙහි දැක සෙබළුන් රැක සිටින
- සලෙළුන් යනෙන නිති කැර කෙළි කවටාන
- අහසින් අවුත් මිණි අක් නයිඳු යැදුමට
- මල්දම් සුවඳ දුම් සොඳ වරලසිනි
- කල්ගිම් නිවා සැනසෙන සිහිලස රසිනි
- නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරින
- බල සේනානායක සපු කුමරු එන
- සුරරද සමන් සමගින් සුරඟන එ වර
- කැර පුද වඳින රුඳි මුනි සිරිපා තඹර
- පෙර උවිදා ගෙණෑ ගිරිඳා සිඳු සලත
- වස් දඬු බිගු කොවුල් වීණා නද මියුරු

වෙනත් උදාහරණ ද පිළිගන්න. **(ලකුණු 15යි.)**

**නැතහොත්**

(අ)

- සර්පයකු තම පුතුට දෂ්ට කළ අවසථාවේ උපාසිකාවගේ චරිතයෙන් මතු කෙරෙන ඉවසීමේ ගුණය
- ධර්ම ශ්‍රවණය කිරීමට දක්වන දැඩි කැමැත්ත
- උපාසිකාව සත්‍යක්‍රියානුභාවයෙන් පුතු සුවපත් කර ගැනීමට ගන්නා උත්සාහය තුළින් ධර්මය කෙරෙහි ඇය තුළ ඇති ශ්‍රද්ධාවත් විස්තර කරමින් පිළිතුරු ගොනු කර තිබීම අවශ්‍ය ය.

(ආ)


- මහතෙරුන් වහන්සේ බණ ඇසීමට දක්වන දැඩි කැමැත්ත
- උන් වහන්සේගේ ඉවසීමේ ගුණය
- සර්පයා දෂ්ට කළ අවස්ථාවේ සර්පයා අල්වා ගෙන තබා ගත් අයුරු මගින් මහ තෙරුන් වහන්සේගේ නිර්භීතකම
- අනතුරුව සත්‍යක්‍රියානුභාවයෙන් විෂ සමනය කර ගැනීමට ගත් උත්සාහය තුළින් උන්වහන්සේ තුළ ධර්මය කෙරෙහි වූ ශ්‍රද්ධාවත් විස්තර කරමින් පිළිතුරු ගොනු කර තිබීම අවශ්‍ය ය.

**ලකුණු 15යි.**

එක් කරුණකට උදාහරණ දෙක බැගින් **ලකුණු 04යි.**
විස්තර කිරීමට **ලකුණු 11යි.**

**ලකුණු 15යි.**


**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




හතරවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වූවකි. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් පිළිතුරු සපයා ඇත්තේ 64%ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 15කි.

ඉන් ලකුණු 0 - 3 ප්‍රාන්තරයේ 25%ක් ද
4 - 7 ප්‍රාන්තරයේ 29%ක් ද
8 - 11 ප්‍රාන්තරයේ 33%ක් ද
12 - 15 ප්‍රාන්තරයේ 13%ක් ද

වශයෙන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 7ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් පිරිස 54%කි. ලකුණු 8ත් 15ත් අතර ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 46%කි.




4 ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. මෙහි දී '' සැළලිහිණි සංදේශය '' ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නය සඳහා පහසුතාව 55%ක් වන අතර '' සද්ධර්මාලංකාරය '' ඇසුරෙන් සකස් වූ විකල්ප ප්‍රශ්නයෙහි පහසුතාව 46%කි. ඒ අනුව ප්‍රශ්නයට අදාළ ව පිළිතුරු ගොනු කිරීමේ දී සද්ධර්මාලංකාරයෙන් උදාහරණ සැකසීම, සැළලිහිණි සංදේශය ඇසුරෙන් උදාහරණ සැකසීමට වඩා සංකීර්ණ වීමක් දැකිය හැකි විය.

නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න පිළිබඳව අයදුම්කරුවන් දැනුවත් කිරීමත් ප්‍රශ්නයට අදාළ ව පිළිතුරු ගොනු කර ගැනීමට හුරු කිරීමත් අවශ්‍ය බැවින් පන්ති කාමරයේ දී ඒ පිළිබඳව අවධානය යොමු කිරීමට ගුරුභවතුන් කටයුතු කළ යුතු බව අවධාරණය කෙරේ.

**5 ප්‍රශ්නය**

**අපේක්ෂණය : විචාර හා රසවින්දන හැකියාව මැනීම**
**ව්‍යුහය : 5,6,7 ප්‍රශ්නවලින් එකක් තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය.**

5. ශිෂ්‍යයෙකු තම අභිප්‍රාය කරා ළඟා වීමට දක්ෂ ගුරුවරයකුගේ මග පෙන්වීම බෙහෙවින් ඉවහල් වෙයි. චුල්ලසෙට්ඨි ජාතකය ඇසුරෙන් උදාහරණ **තුනක්** දක්වමින් මෙම අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- චුල්ලපන්ථක තෙරුන් වහන්සේ සිය සොහොයුරු මහාපන්ථක ස්ථවිරයන් විසින් විහාරයෙන් නෙරපා හරින ලදුව ගිහි වීමට සිතා නික්මුණු අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ දැක උන්වහන්සේ සමග යාම සහ බුදුරජාණන් වහන්සේ දුන් උපදෙස් අනුව කටයුතු කිරීම.

- බුදුරජාණන් වහන්සේ දුන් උපදෙස් නියමාකාරයෙන් පිළිපැදීම හේතුවෙන් රහත්භාවයට පත් වීම.


- බුදුරජාණන් වහන්සේ අනුදැනුම ඇතිව අනුමෙවෙනි ධර්ම දේශනාව කිරීමට චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේට අවස්ථාව උදා වීම.

- අතීත කථාවේ දී මහාබෝසතාණන් කළ ප්‍රකාශයකට අනුව යමින් දුගී පුරුෂයෙකු එනුවර සිටු තනතුරට පත් වීම.

උදාහරණ තුනක් දක්වමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍ය ය.

**ලකුණු 10යි.**


**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය චුල්ලසෙට්ඨි ජාතකය ඇසුරෙන් සැකසී ඇත. අපේක්ෂකයන්ගෙන් 39%ක් පමණ ඊට පිළිතුරු සපයා ඇත. එහි සමස්ත පහසුතාව 34%කි. ලකුණු 6ත් 10ත් අතර ලබා ගෙන ඇති ප්‍රතිශතය 27%කි. 73%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.
මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 10කි.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 0 - 2 | ප්‍රාන්තරයේ | 37%ක් ද |
| | 3 - 5 | ප්‍රාන්තරයේ | 36%ක් ද |
| | 6 - 7 | ප්‍රාන්තරයේ | 20%ක් ද |
| | 8 - 10 | ප්‍රාන්තරයේ | 7%ක් ද |

ලකුණු ලබා ගෙන ඇත.




චුල්ලසෙට්ඨි ජාතකය ඇසුරෙන් පිළිතුරු ලිවීමට තිබූ මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 34%කි. නිර්දිෂ්ට පුරාතන සාහිත්‍ය කෘති පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කිරීමත් ඒ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු කිරීමත්, නිරන්තර අභ්‍යාසවල නිරත කරවීමත් මඟින් මෙවැනි ප්‍රශ්නවලට උපරිම ලකුණු ලබා ගැනීමට අවස්ථාව සැලසිය හැකි ය. ඒ පිළිබඳ ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු බව අවධාරණය කෙරේ.

## 6 ප්‍රශ්නය

අපේක්ෂණය : විචාර හා රසවින්දන හැකියාව මැනීම

ව්‍යුහය : 5,6,7 ප්‍රශ්නවලින් එකක් තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය.

6. ''රන් තැටියක කඳුළු' කවි පෙළින් මතු කෙරෙනුයේ තිඹිරි ගෙයි දීම මිය ගිය තම දියණිය වෙනුවෙන් පියෙකු නගන ශෝකාලාපයකි. උදාහරණ තුනක් දක්වමින් විමසන්න. *(ලකුණු 10 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

දියණියගේ වෙන්වීම හමුවේ පියා නගන ශෝකාලාපය අදාළ පද්‍ය පාද ඇසුරු කරගෙන විස්තර කර තිබීම අවශ්‍ය ය.

- මා පමණි ඔබ කැටුව ආවේ
  මම ද යමි දියණියනි

- මෙතෙක් ලොව නොඇසුව
  මියුරු නැළවිලි ගී
  ළයට කැටිකොට නිදයි ඔබෙ මව

- වෙස් මුහුණු තුළට වූ බහිරයින්
  වට වෙමින් අඬු තියෙන්


- බලා සිටියෙමි කොණෙක
  ගොළු වෙමින් අසරණව

- නුහුරු නුපුරුදු ලොවක
  සැතපෙන්න දියණියනි

වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.

**ලකුණු 10යි.**

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 6%කි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු ගණන 10කි.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 0 - 2 | ප්‍රාන්තරයේ | 37%ක් ද |
| | 3 - 5 | ප්‍රාන්තරයේ | 13%ක් ද |
| | 6 - 7 | ප්‍රාන්තරයේ | 25%ක් ද |
| | 8 - 10 | ප්‍රාන්තරයේ | 25%ක් ද |

ලකුණු ලබා ගෙන ඇත.

අපේක්ෂකයන්ගෙන් 50%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත. 6ත් 10ත් අතර ලකුණු ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය ද 50%කි.




''රන් තැටියක කඳුළු'' කාව්‍ය නිර්මාණය ඇසුරෙන් පිළිතුරු ලිවීමට තිබූ මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 30%කි.

5,6,7 යන ප්‍රශ්නවලින් අඩු ම පහසුතාවක් ලබා ගෙන ඇති මෙම ප්‍රශ්නයට මධ්‍යස්ථ ලකුණු ප්‍රමාණයක් ලැබීමට හේතු වී ඇත්තේ නිර්දිෂ්ට පද්‍ය කෘතිය පිළිබඳ ව අපේක්ෂකයන්ගේ අවධානය නිසි පරිදි යොමු වී නොතිබීමත්, නූතන සාහිත්‍ය පිළිබඳ අවබෝධ කර ගැනීමට අවශ්‍ය නිසි මග පෙන්වීම ප්‍රමාණවත් නොවීමත් ය.

## 7 ප්‍රශ්නය

අපේක්ෂණය : විචාර හා රසවින්දන හැකියාව මැනීම

ව්‍යූහය : 5,6,7 ප්‍රශ්නවලින් එකක් තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය.

7. ජීවන අරගලය ජය ගැනීම සඳහා කටුක වෘත්තීන්හි යෙදෙන ගැමි ජනයා කෙරෙහි කොළඹ යුගයේ කවීන් සංවේදී වූ ආකාරය නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් උදාහරණ තුනක් දක්වමින් විමර්ශනය කරන්න. *(ලකුණු 10 යි)*


**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- ලෙච්චමීගේ සිතුවිල්ලක්
- අඳුර අපේ දුක නිවාවි
- කුරක්කන් හේන
- ධීවරී ගීතය

වැනි පද්‍ය පන්තිවලින් උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය. **(ලකුණු 10යි.)**

| | |
|---|---|
| 5, 6, 7 ප්‍රශ්න සඳහා උදාහරණ තුනට | **ලකුණු 03යි.** |
| විස්තර කිරීමට | **ලකුණු 07යි.** |
| | **ලකුණු 10යි.** |

## 7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :





ජීවන අරගලය ජය ගැනීම සඳහා කටුක වෘත්තීන්හි යෙදෙන ගැමි ජනයා කෙරෙහි කොළඹ යුගයේ කවීන් සංවේදී වූ ආකාරය පාදක කර ගෙන සැකසුණු මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂක සංඛ්‍යාව 16%කි. මෙහි සමස්ත පහසුතාව 44%කි. ලකුණු 10ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 0 - 2 | ප්‍රාන්තරයේ | 43%ක් ද |
| | 3 - 5 | ප්‍රාන්තරයේ | 27%ක් ද |
| | 6 - 7 | ප්‍රාන්තරයේ | 23%ක් ද |
| | 8 - 10 | ප්‍රාන්තරයේ | 07%ක් ද |

ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකන්ගෙන් 70%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි. ලකුණු 6-10ත් අතර ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 30%කි.




කොළඹ කවීන්ගේ නිර්මාණවලින් නිර්දිෂ්ට පද්‍ය ඇසුරෙන් සැකසී ඇති මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගෙන් ලකුණු 6ට වඩා අඩුවෙන් ලබා ගෙන ඇති 70% අතුරෙන් ලකුණු 0ත් 2ත් අතර ලබා ගෙන ඇති සංඛ්‍යාව 43%කි. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නයට අපේක්ෂකයන් සපයා ඇති පිළිතුරු ප්‍රශස්ත මට්ටමක නොතිබූ බවයි.

6,7 ප්‍රශ්න දෙක ම නූතන පද්‍ය ඇසුරෙන් සකසා තිබුණු අතර ලකුණු ලබා ගැනීමේ දී අඩු සාධන මට්ටම් පවතින අයුරු දක්නට ලැබුණි. මෙයින් ගම්‍ය වනුයේ නූතන පද්‍ය රස වින්දනය සඳහා නිසි මඟ පෙන්වීමක් අපේක්ෂකයන්ට ලබා දීමේ අවශ්‍යතාවයි. ඒ අනුව නූතන පද්‍ය අනුසාරයෙන් සකසා ගත හැකි ප්‍රශ්න පිළිබඳව අපේක්ෂකයන් දැනුවත් කිරීමටත් පිළිතුරු ලිවීම සඳහා නිසි පුහුණුවක් ලබා දීමටත් නිරන්තරයෙන් අභ්‍යාසවල යෙදවීමටත් ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු ය.

# III කොටස

## 3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

**පොදු උපදෙස්**

- ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතු ය. මේ සඳහා අමතර කියවීම් කාලය ඵලදායී ලෙස භාවිත කළ හැකි ය.

- ප්‍රශ්න පත්‍රයේ පළමු කොටසට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ එක් පිළිතුරක් පමණක් තෝරා ගත යුතු ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයා තිබේ දැයි සුපරි-ක්ෂාකාරී විය යුතු ය.

- I ප්‍රශ්න පත්‍රයේ II කොටසට හා II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

- නිවැරදි හා පැහැදිලි අත්අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

- අපේක්ෂකයාගේ විභාග අංකය හා පිටු අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

- නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය. අදාළ අවස්ථාවල දී සුදුසු නිදසුන් ඉදිරිපත් කළ යුතු ය.

- පිළිතුරු සමන්විත විය යුතු වචන සංඛ්‍යාව දී ඇති විට එම වචන සංඛ්‍යාවට හැකි තරම් ආසන්න වචන සංඛ්‍යාවකින් යුතු වන සේ පිළිතුරු සංවිධානය කර ගත යුතු ය. එසේ නොවීම ලකුණු අඩුවෙන් ලැබීමට හේතු විය හැකි ය.

- පිළිතුරු ලිවීමට සැපයෙන පොතේ සඳහන් විශේෂ උපදෙස් ද කියවා අවබෝධ කර ගත යුතු ය.

**විශේෂ උපදෙස්**

- අත් අකුරු හා අක්ෂර වින්‍යාසය පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

- ශිල්පීය දක්ෂතා එනම් පද බෙදීම, විරාම ලක්ෂණ, අදාළ පරිදි ඡේද වෙන් කොට ලිවීම යන අංශ පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

* සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙළපොත්වල ඇති පාඩම්, දෘශ්‍යාධාර හා ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථ භාවිත කරමින් නිවැරදි ව ලිවීමේ හැකියාවත් අක්ෂර මාලාවේ ඇති විවිධ ප්‍රභේද පිළිබඳව නිවැරදි අවබෝධයත් ලබා දීම අවශ්‍ය ය.

* අක්ෂර වින්‍යාසය බොහෝ විට වැරදි ලෙස භාවිත කෙරෙන වචන තෝරා ගෙන ඒවා නිවැරදි ව භාවිත කිරීම සඳහා සතතාභ්‍යාස කළ යුතු ය.

* උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව පෙළපොතේ දැක්වෙන අභ්‍යාසවලට අමතර ව තවත් අභ්‍යාසවල යොදවමින් ක්‍රියාකාරකම්වල නිරත කළ යුතු ය.

* කර්මකාරක හා කතෘකාරක වාක්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සතුටුදායක නොවන බැවින් මනා ඉගැන්වීම් ක්‍රම මගින් හා වඩ වඩාත් අභ්‍යාසවල යෙදවීම මගින් භාවිත හැකියාව ඉහළ නැංවීමට පියවර ගත යුතු ය.

* සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහ්වර්ථ පද ඇතුළු වාග් කෝෂය සංවර්ධනය සඳහා උපකාර වන සරල අභ්‍යාසවල නිරත වීමට අවස්ථා සම්පාදනය කළ යුතු ය.

* ව්‍යාකරණ ඉගැන්වීමේ දී ප්‍රායෝගික ජීවිතය ඇසුරෙන් නිදර්ශන සපයමින් රසවත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් විසින් නිර්මාණය කර ගත යුතු ය.

* රචනා ලිවීමේ දී ව්‍යුහගත රචනාවක් යනු කුමක් දැයි පැහැදිලි කර විභාගයේ දී එවන් රචනාවකට ලකුණු ලැබෙන පිළිවෙළ හා ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳ ව මග පෙන්වීමක් කළ යුතු ය.

* ප්‍රායෝගික ලේඛන ලිවීමේ දී ඒ ඒ ලේඛනවල වෙනස හඳුන්වා දී ආකෘතිවල වෙනස්කම් සිසුන්ට පැහැදිලි කර දිය යුතු ය. වාර්තා, අත්පත්‍රිකා, දැන්වීම්, රාජකාරී ලිපි ඇතුළු ලේඛන කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ලේඛන අද්දැකීම් ලබා දීමට ක්‍රියා කළ යුතු ය.

* පැරණි ගද්‍ය සාහිත්‍ය පාඩම් සිසුන් ලවා කියවීම හා කියවීමෙන් අවබෝධය ලබා ගැනීමේ අවස්ථාව ලැබෙන පරිදි අභ්‍යාස සැලසුම් කළ යුතු ය.

* සාහිත්‍ය පෙළපොතෙහි පාඩම් මගින් රසාස්වාදය සඳහා ඉඩ ප්‍රස්තා ලැබෙන පරිදි හැකි සෑම විට ම නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමට සුදුසු ඉගෙනුම් - ඉගැන්වීම් අවස්ථා සම්පාදනය කළ යුතු ය.

* නිරන්තර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව සිසුන් නිර්මාණකරණයේ යෙදවීමට ද උනන්දු විය යුතු ය.

* ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

* වාර විභාග ලකුණු පදනම් කර ගනිමින් සිංහල විෂය සමත් වීමේ ලකුණු සීමාවට ආසන්න වී ඇති සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

* සංවේදීභාවයෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහි කිරීමෙහි ලා සාහිත්‍යයෙන් සිදු වනුයේ අනුපමේය මෙහෙයකි. එවන් පුද්ගලයන් සමාජයට මහඟු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි සිසුන් වඩාත් හොඳින් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳව ගුරුභවතුන් ඇතුළු අදාළ නිලධාරින්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.